
භක්ති ප්‍රබෝධනය
පවුලේ සඟරාව

# භක්ති ප්‍රබෝධනය

සියවසක් ඉක්මවූ නොනවතින යුග මෙහෙවර

2024 මැයි - ජූනි | 125 වන කාණ්ඩය - 03 කලාපය | පිටු 32 | DOP/NEWS/01/2024

## පල්ලියේ මංගල්‍යය



ශ්‍රී ලංකාවේ පළවන ඉපැරණිම සිංහල සඟරාව

ආරම්භය 1899

# සරා සිප් සයුරු...

ගී පද - ආචාර්ය සෝමරත්න දිසානායක
තනු නිර්මාණය - ආචාර්ය රෝහණ වීරසිංහ
ගායනය - හර්ෂණ දිසානායක



සරා සිප් සයුරු
පතා යස ඉසුරු
කොහේදෝ යන්නේ
දමා තනිකර දීනූ ගම සොඳුරු

වෙලේ මඳනල දොලේ සිසිලස
සිදාදියටත් දැනෙනවාදෝ
ගමේ සඳ තරු පෙනෙනවාදෝ
අනේ ආයෙත් එන්නෙ කවදාදෝ

ඉසුරු සිරිපිරි සුපිරි තරුවල
පමණි රුස්මාලේ
අකුරු අඩු ඇයි ගමේ ඉස්කෝලේ
සොඳුරු ගම යළි දකිම් කොයි කාලේ

සරා සිප් සයුරු ...

සිප්සතර හදාරනු වස්, ගමින් නගරය වෙත පියමං කළ දරුවකු ගැන කියැවෙන සුන්දර ගී සිත්තමකි, "සිරි රජ සිරි" චිත්‍රපටියේ එන මේ ගීතය. ඔහු ගම හැර දමා යන්නේ යස ඉසුරින් පිරි හෙටක් තනා ගන්නා සිහිනය සාක්ෂාත් කරගනු පිණිසය.

එනමුදු, වෙලේ මඳනල, දොලේ සිසිලස එක්ව මවන ගමේ සොඳුරු බව සිදාදියේ දක්නට තිබේද? නොමැත. නැවතත් ගමට යාමේ අවංක පැතුමට ඔහු ආසක්ත (බැඳීමක් ඇති වෙනවා) වන්නේ එබැවිනි.

ගමේ හා නගරයේ පරස්පර විරුද්ධත්වය පිළිබඳව ගීත රචකයා මවන මෙම රූපකය, අපගේ ආධ්‍යාත්මික ජීවිතයට ද උපමා කර ගත හැකි නොවේද? ගම හැරදා යස ඉසුරු සොයා සිදාදියට යන්නකු සේ අපිත් දෙවියන් හැරදා ලෞකික ලෝකය වෙත කොතෙකුත් ඇදී යමු. එහෙත් කලක් ගත වන විට, යථාර්ථය අවබෝධ වී නැවතත් දෙවිඳුන් වෙතට හැරී ඒමේ ආශාවක් උදා වන්නට ද හැකිය.

"ඉසුරු සිරි පිරි සුපිරි තරුවල" ඇත්තේ පුහු රුස් මාලාවක් බව පමණක් පසක් වන විට නැවත සදාකලික ප්‍රේමය වූ මැවුම්කරුවාණන් සොයා යාම, සරුවපිත්තල නගරය හැරදා නැවත සොඳුරු ගම් දනව්ව කරා ඇදී යන්නා වැනිය.

සැබැවින්ම ජීවිතයේ ගැඹුර අවබෝධ කර ගන්නා, නැවත දෙවිඳුන් වෙතට කවදා හෝ හැරී එනු ඇත. තම පටු ආත්මාර්ථකාමී අභිමතාර්ථ හැරදා සදාකාලික ස්වර්ගීය ජීවිතයකට අවැසි මංපෙත් විවර කරගනු ඇත. එවන් වූ මාහැඟි බලාපොරොත්තුවක් සැම කිතුනුවෙක් තුළම වේ නම්, එය කෙතරම් භාග්‍යයක්ද?

**ගරු ශානිල් දිනුක ජයවර්ධන නිමනි පියතුමා**
**අධ්‍යක්ෂ, 'මැසනඩ් යොවුන් පියස', සා. විසෙන්ති නිවාසය, මග්ගොන.**

# ශක්ති ප්‍රබෝධනය

**2024 මැයි - ජූනි**


**ප්‍රකාශනය**
නිර්මල මරිය නිකාය

**භාරකරු**
අතිගරු රොෂාන් සිල්වා නි ම නි පියතුමා
නිර්මල මරිය නිකායික ප්‍රාදේශාධිපති
කොළඹ ප්‍රාදේශිකය

**සංස්කාරක**
ගරු එමාඩ් දල්පතාදු නි ම නි පියතුමා

**සංස්කරණ සහාය**
රූපස් ප්‍රැන්සිස්
ටී. සුනිල් ප්‍රනාන්දු
ෆිලීෂන් අබයකෝන්

**කවරය නිර්මාණය**
අචල රූපසිංහ

**පරිගණක පිටු සැකසුම**
ආනන්ද නාගහගේ

**මුද්‍රණය**
කතෝලික මුද්‍රණාලය
කොළඹ 08.


## පිටුවෙන් පිටුව..........


2 කවරයේ කථාව

3 හෙළිදරව්ව

5 සමිඳු කෙත සරු කළ රුවන්පුර ...
රත්නපුර පදවියේ සිව්වන රදගුරුතුමා ...
ගරු ඩී. එෆ්. මැදගොඩ පියතුමා

6 සාන්තුවර මංගල්‍ය සම්ප්‍රදායේ සුලමුල ...
ආචාර්ය ගරු සිසිල් ජෝයි පෙරේරා පියතුමා

12 දුප්පතාගෙ දුක නිවන්නා - අයිරින් කොස්තා
ශාස්තෲවරු සහ ආගම් - සපුගස්කන්දේ රංජිත්

13 ඇතුළාන්ත ජීවිත වෙනසක් වෙත අප ...
අති ගරු රොෂාන් සිල්වා නි ම නි පියතුමා

16 කන්තාරු මාස්ටර්
ඇග්නස් චන්ද්‍රකාන්ති ජයමාන්න

17 ලක් කිතු සසුනේ ආරම්භය පෘතුගීසින්ගෙන්ද?
බී. කේ. මාලින්ද එරෝෂාන් රුදිගු

20 නුඹලාගේ මංගල්ල ... ෆිලීෂන් අබයකෝන්

21 ඕං එහෙනං - සූරිය මාමා

22 **Our Church Feast** - Gihan Fernando

23 කාව සිත - චමත් බි පයාගල සහ
අමිතගේ හද ගැස්ම - සී. අමිත

24 පල්លියේ මංගල්‍යයයි - කිතුනු අපේ ...
බුද්ධික සඳරුවන්

26 පුංචි විකුම් - තරු නැන්දා

27 ප්‍රහේලිකා අංක - 79
ගරු චාමික සුදර්ශන නි ම නි පියතුමා

28 ප්‍රහේලිකා අංක 77 පිළිතුරු


29 අ. පො. ස. (සා. පෙළ) ආදර්ශ ප්‍රශ්න පත්‍රය II
ජේ. ඒ. එල්. ශ්‍රීමති සිල්වා මෙනවිය

31 අ. පො. ස. (උ. පෙළ) ක්‍රිස්තියානි ධර්මය ...
එස්. හේමාල් පෙරේරා

භක්ති ප්‍රබෝධනය

වසර 1899 සිට අඛණ්ඩව
එළිදක්වන භක්ති ප්‍රබෝධනය
ශ්‍රී ලංකාවේ පළවන
ඉපැරණිම සිංහල සඟරාවයි.
භක්ති ප්‍රබෝධනය
නිර්මල මරිය නිකායේ
කොළඹ ප්‍රාදේශිකයේ
භාරකාරත්වය යටතේ
පළවන ප්‍රකාශනයකි.
(නි.ම.නි.)

Bhakthi Prabodhanaya,
Published continuously
since 1899, is the oldest
Sinhala magazine
in Sri Lanka.
Bhakthi Prabodhanaya,
is owned and published by
the Colombo Province of the
Oblates of Mary Immaculate.
(O.M.I.)




## කවරයේ කථාව

අද වන විට ප්‍රසිද්ධ දේවස්ථානයේ සිට ගමේ කුඩා දේවස්ථානය දක්වාම එහි මංගල්‍යය ඇතැම් ස්ථානවල හුදෙක් මුදල් ඉලක්ක කරගත් වෙළඳාමක් වී ඇති බව කනගාටුවට කරුණකි. බැතිමත් ජනයාද මංගල දිනය අරඹයා කෙරෙන බාහිර ක්‍රියාකාරකම්වල පමණක්ම සිරවී මංගල්‍යයේ සැබෑ අරමුණ බොඳවන්නට ඉඩ හැර ඇත. ඉදින් මෙවර කවරයේ සැඟවුණු කතා පුවතින් අපට ඇරයුම් කරන්නේ මංගල්‍යය යැයි පවසමින් අප කරන බාහිර ක්‍රියාකාරකම්වල පමණක්ම නොරැඳී එතුළින් අපව යොමුකරන ගැඹුරු ආධ්‍යාත්මයේ ද්වාරය විවර කරගෙන තිර ඇඳහිල්ලේ පවතින්නටය.

අචල රූපසිංහ

**භක්ති ප්‍රබෝධනය**

දායකත්වය එක් වසරකට - රු. 850.00
(මුද්දර ගාස්තුව ද ඇතුළුව)
දායකත්වය වසර දෙකකට - රු. 1700.00
(මුද්දර ගාස්තුව ද ඇතුළුව)

සියලුම ලිපි, දායකත්ව මුදල් හා විමසීම් මේ ලිපිනයට යොමු කරන්න.

සංස්කාරක පියතුමා.
"භක්ති ප්‍රබෝධනය"
265, ඩීන්ස් පාර, මරදාන, කොළඹ 10.
දුරකතන : 0112 698 177
විද්‍යුත් තැපැල :
bhakthi.prabodhanaya@gmail.com
වෙබ් ලිපිනය : bpomi.org

**BHAKTHI PRABODHANAYA**

Rs. 850.00 for a year (Including Postage)
Rs. 1700.00 for two years
(Including Postage)

All articles, subscriptions and inquiries should be sent to this address.

Editor.
"Bhakthi Prabodhanaya"
265, Deans Road, Maradana,
Colombo 10, Sri Lanka
Tel. : 0112 698 177
Email: bhakthi.prabodhanaya@gmail.com
Web Address : bpomi.org

# පල්ලියේ මංගල්‍යය

## හෙළිදරව්ව

පල්ලියේ මංගල්‍යයට පෙර සූදානම් කිරීම සඳහා නොවාන දේශනා කරන්නට විවිධ පදවිවල දෙව් මැදුරුවලට මා ගිය කල අපගේ සමහර කතෝලික බැතිමතුන් තම පල්ලියේ මංගල්‍යවල සරු නිසරු බව මනින්නට උපයෝගී කර ගත් මිනුම් දඬු කීපයක් පාඨක ඔබ ඉදිරියේ තබමි.

"පියතුමනි, මේ සැරේ අපේ මංගල්‍යය සරුයි. හන්දි කීපයකම කොඩි ගස් කීපයක් සිටුවන්නට පුළුවන් වුණා. තොරන් කීපයක් හැදුවා, ශුද්ධවන්තයන්ගේ ප්‍රතිමාව දෙව් මැදුරෙන් එළියට ගත් වෙලාවේ සිට නැවත දේවස්ථානයට ගෙන යනකම්ම එකම රතිඤ්ඤා හඬයි. රසකැවිලි, රඹුටන්, උක්ගස් වැනි පලතුරු සහ සරුවත් කඩ, සෙල්ලම් බඩු කඩ මේ සැරේ වැඩියි. ගම පුරාම අපි ශබ්ද විකාශන යන්ත්‍ර දැම්මා. විදුලි පහන් හැම තැනම, වෙස්පර්ස් වලින් පසුව මල් වෙඩි සංදර්ශනයක් දැම්මා, හරිම ලස්සණයි. මංගල්‍යය මෙදා සැරේ හරි සරුයි. මේ අයුරින් බාහිර අලංකාරය මිනුම් දණ්ඩක් කරගෙන, තමන්ට ලැබෙන වාසි සහ ලාභ පෙරදැරි කර ගෙනද, මංගල්‍ය සරු බව ඇතැම්හු ප්‍රකාශ කරති.

ශුද්ධ වූ බයිබලයට අනුව ජුදා මංගල්‍යවලට හිමිවී ඇත්තේ විශේෂ ස්ථානයකි.

* පාස්කුව සහ නුමුහුන් රොටි මංගල්‍යය (ලෙවී ව්‍යවස්ථාව 23:5-6)
* නාඹුල් පල මංගල්‍යය (ලෙවී ව්‍යවස්ථාව 23:9-21)
* අස්වැන්න මංගල්‍යය (ගණන් කථාව 23:15-21)
* කූඩාරම් මංගල්‍යය (ගණන් කථාව 29:12-40)
* දේව මාලිගාව සහ පූජාසනය කැප කිරීමේ මංගල්‍යය (මකබිවරු 4:52-56)

ඉහත සඳහන් වන සෑම මංගල්‍යයකම පොදු සාධකය වනුයේ දෙවියන් වහන්සේගේ අණපණත් වලට අවනතව සමිඳාණන් වහන්සේට නමස්කාර කිරීම සඳහා ශුද්ධ වන්දනාමාන සිදු කිරීමය. "සමිඳාණන් වහන්සේගේ ගෞරවයට දින හතක්ම මංගල්‍ය පැවත්විය යුතුය"(ගණන් කථාව 29:12 තෙවන වාක්‍යය).

අද අපගේ බොහෝ දේවස්ථානවල වාර්ෂික මංගල්‍යය පවත් වනුයේ ඒ දෙව්මැදුර කැපකර ඇති සාන්තුවරයා හෝ සාන්තුවරිය නමිනි, නැතහොත් මරියතුමියගේ හෝ ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ ජීවිතයේ කිසියම් සිද්ධියක් මුල් කර ගෙනය. එසේත් නැතිනම් ශුද්ධාත්මයාණන් වහන්සේ වෙනුවෙනි. මේ සියලුම සිද්ධි විශේෂ වන අතර ඒවා අප ජීවිත වලට ගැලවුම්දායක පණිවුඩයක් අත්කර දෙයි. සාන්තුවරයන්ගේ මංගල්‍යය වශයෙන් කතෝලික සභාව බොහෝ විට සමරන්නේ ශුද්ධවන්තයා හෝ ශුද්ධවන්තියගේ ස්වර්ගස්ථ වූ දිනය ය. ඒ නිසා ග්‍රාමය අරක්ගත් මුනිවරයා සමරන කාලයේ අපි එතුමන්ලාගේ සහ එතුමියලාගේ ජීවිත වෙනුවෙන් දෙවි මහෝත්තමයාණන්ට තුති පුදන, ගෞරව කරන සහ මැදිහත්කම පතන, යදින සමයක් ලෙස හඳුනාගත හැකිය. මුනිවරයකුට දැක්විය හැකි උසස්ම ගෞරවය නම්, ඒ සාන්තුවරයා ක්‍රිස්තු ජීවිතය තම ජීවිත අත්දැකීමක් කරගත් ආකාරයට අපද සුදුවර චරිත සැබෑ ජීවිත අත්දැකීමක් කරගෙන, ක්‍රිස්තු වචනය තුළ ශක්තිමත් වී ජීවත් වීමය. සෑම මනුෂ්‍යයකුම දුර්වලය. පාපයට වැටීමේ ප්‍රවණතාව වැඩිය. එබැවින් කිතු දහම උගන්වන ත්‍රිවිධ නපුරු බලවේග වන යක්ෂයා, ලෝකයා සහ මාංසයා ජය ගන්නට නිරන්තර අරගලයක යෙදිය යුතුය. සියල්ල මුදලින් තීරණය කරන සමාජයක මෙකී අරගලය ජය ගැනීම ඉතාම අසීරුය. නා නා ප්‍රකාර මුද්‍රිත සහ ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය හරහා මිනිසා සෑහීමකට පත් නොවන අතෘප්තිකර ආශා සහ ක්ලේශ පසු පස්සේ හඹායාම නිරායාසයෙන් සිදුවීමට ඇති ඉඩකඩ බොහෝය. විටක කිතුනු වටිනාකම් පසක ලා තම ඉලක්ක සපුරා ගන්නට ඇති ඇල්ම සහ බැල්ම හොඳින් හෝ නරකින් ඉටුකරගන්නට යාම නිසා සමස්ත සමාජය ම අද අවුල් වී ඇත. මෙලෙස තාවකාලික ජීවිතයක් පසු පස හඹා යන අප සදාකාලික ජීවිතයක් කෙරෙහි අවධානය යොමු කිරීමට අතපසු කරන අයුරු කියන හා කරන දෑ තුළින් පෙන්නුම් කරයි.

පැවිදි හා පූජක හැම කෙනකුටම වසරකට වරක් දින 5 ක් 6ක් හෝ 8 ක ධර්ම විවේකයක යෙදීමට අවස්ථාවක් ලැබුණද, ගිහි ජනතාවට එවැන්නක් උදාවන්නේ කලාතුරකිනි. එහෙත් ශ්‍රී ලාංකික

කතෝලිකයන්ට තම දේවස්ථානයේ වාර්ෂික මංගල්‍යයට පෙර සූදානම් වීමේ කාලයක් ඇත. මේ සමයේදී දිනපතා නොවානය, දේශනාව සමග දිව්‍ය පූජාව ප්‍රධාන තැනක් ගනියි. එය පැහැදිලිවම ඥානකාන්තියක ස්වරූපයක් ගන්නා අතර ඥානකාන්තියක් යනු කිමෙක්ද යන්න අවබෝධ කර ගැනීම මෙහිදී වැදගත්ය. තමන්ගේ ආධ්‍යාත්මික ජීවිතයට ආලෝකයක් දෙන ධාර්මික ක්‍රමවේදය ඥානකාන්තියක් ලෙස විග්‍රහ කළ හැකිය. හතුරු නපුරා පරදන්නට වැරදි මාර්ග අතහරින්නට හෝ අවම කරන්නට, සමිඳාණන් වහන්සේගේ වචනය හරහා මනස්තාප වී හැරී එමින් අලුත් ජීවිත මඟකට පිවිසෙන්නට විශ්වාසකයන්ට අත හිත දෙන ආධ්‍යාත්මික වැඩ පිළිවෙළකි, පල්ලියේ මංගල්‍යයට පෙර සූදානම් වන කාලය. විවිධ තේමා ඔස්සේ ගොඩ නඟන දේශනා තුළින් සැබෑ තත්ත්ව පරීක්ෂණයකට ලක් කිරීමට ජනතාව මෙහෙයවන වරප්‍රසාදීය, ආශීර්වාදාත්මක කාලයකි මේ. මේ ආශීර්වාදාත්මක කාලයේදී සැලකිය යුතු කිතුනු පිරිසක් සැබෑ මනස්තාපයක් තුළ සමඟි සන්ධානය නමැති දේව ප්‍රසාද නිධානයට සහභාගි වෙමින් ජීවිත වෙනසක් ඇති කරගෙන ගමනක් යන්නට පෙරුම් පුරන, අධිෂ්ඨාන කරන අවසථාවක් ලෙස නිරීක්ෂණය වේ.

අවාසනාවකට, තවමත් ඇතැම් දෙව්මැදුරුවල මංගල්‍යයට පෙර සූදානම් වීමේ කාලය බාහිර සෝෂා සහ විවිධ ක්‍රියාකාරකම් පමණ ඉක්මවා යාම නිසාම මංගල්‍යයේ සැබෑ අරුත ගිලිහී යයි. එවන් දැ නිසාම වාර්ෂික මංගල්‍යය තුළින් ගත හැකි දේව භය භක්තිය, දේව වචනයට ඇති ගෞරවය සහ පිපාසය, දේව වචනය හරහා ලැබෙන ආධ්‍යාත්මික ශක්තිය සහ ආලෝකය ලැබීමට ඇති අවස්ථාව ජනතාවට ඇහිරී යනු ඇත. ආර්ථික වාසි ඇතැම් තැන්වල ඉලක්ක වීම නිසාම සූදානම් කිරීමේ කාලය තුළ දියත් කෙරෙන විවිධ වෙළඳාම් කිරීම්, සල්පිල්, තොරන් තැනීම්, රතිඤ්ඤා සහ බට්ටො පත්තු කිරීම්, මෙහෙය පවත්වන අවස්ථාවේදී පවා ඇතැම් ස්ථානවල සිදු කිරීම නිසා දේව වචනය හදවතට නිසිලෙස ලැබීමට, යාච්ඤා කිරීමට ඇති පසුබිම බිඳී මුළු පරිසරය පුරා තිබිය යුතු සන්සුන්කම නිහඬියාව බිඳී ගොස් අහිතකර පරිසරයක් ගොඩ නැඟීම අතිශයින්ම කනගාටුදායකය. මුදලින් ලැබෙන වාසියට වඩා කිතුනු සංඝයට අහිමි වී යන කිතුනු වටිනාකම් සහ ඇදහිල්ලේ අත්දැකීම මෙතෙක් යයි තක්සේරු කර ගැනීමට කිසිවකුටත් නොහැකිය. එනිසා ඇති කරන අහිතකර ප්‍රතිඵල අද අපට දැකගත හැකිය. දේව භය භක්තිය, ඇදහිල්ල, සමාව දීම, සහෝදර ප්‍රේමය, අවංකත්වය, නිහතමානකම, ඉවසීම, සංවරය සහ ජීවිතයට මුහුණ දීමට තිබිය යුතු චිත්ත ධෛර්ය, නිවැරදි වටිනාකම් හරහා ජීවිතය ගොඩ නැඟීමට තිබිය යුතු වුවමනාව, අනීතික සහ මනුෂ්‍යයා වනසන ව්‍යාපාරවලින් ඉවත් වීමට ඇති තල්ලුව අද අතුරුදහන් වෙමින් පවතී. නිදසුනක් ලෙස "මඩු" වැනි කතෝලිකයන්ගේ පූජනීය සිද්ධස්ථානයකදී පවා මත්වතුරට සහ සන්ඩුසරුවල් කරන්නට පෙලඹෙන බැතිමතුන් අද වැඩිවෙමින් පවතින බව නිරීක්ෂණය වේ. එවැන්නන්ට මෙවන් ශුද්ධ වූ පූජනීයස්ථාන වලදී පවා අවශ්‍ය වන්නේ හුදු වින්දනයක් ලබා ගැනීම පමණකි. මෙහෙය තුළදී, සම්පූර්ණ මෙහෙය අතරතුර ස්මාර්ට් ජංගම දුරකථනවලින් ඡායාරූප ලබා ගැනීම සහ වීඩියෝ කිරීම දැන් අලුත් විලාසිතාවක් වීම නිසා මෙහෙය තුළදී යාච්ඤා කිරීමට පෙලඹීම, භාවනාශීලීව දැහැන් ගත වීමට ඇති වුවමනාව නැති වී යන අයුරු දැකිය හැකිය. ප්ලාස්ටික් බෝතල් ඇතුළු නොදිරන දෑ ඕනෑම තැනක, ගංගාවලට පවා දමන්නට පෙලඹී ඇත. පරිසරයට ආදරය කරන බැතිමතුන් අඩු වී ඇත.

ඉදිරිපත් කළ කරුණු කාරණ අනුව පල්ලියේ මංගල්‍යය ආත්මික ජීවිතයේ සැබෑ වෙනස්කමක් අත් දකින්නට, හැකි සේම ඉන් අත්වන ප්‍රතිලාභ, ගුණාත්මකව ජීවිතය වෙනස් කර ගැනීමට සැදැහවතුන්ට සැබැවින්ම අත්වැලකි. එබැවින් ඒ සඳහා අවශ්‍ය බාහිර සහ අභ්‍යන්තර පසුබිම නිර්මාණය කර ගැනීමේ වගකීම මීසම් භාර ගරු පියවරුන්ට මෙන්ම සැදැහැවත් කිතුනු ජනතාවට පැවරෙනු ඇත. එමෙන්ම, දේව වචනයට සවන් දෙන බැතිමතුන්ට සැබෑ ආධ්‍යාත්මික පෝෂණයක් සඳහා, මෙහෙයවීම දේශක පියතුමන්ලාගේද වගකීමකි. එය එතුමන්ලාගේ එඬේරික දූත මෙහෙවරයි. සැදැහැවත් ජනතාවගේ සිත් හැරීමකට දේශනා ඉලක්ක විය යුතු අතර එම දෙව් සුබහස්න යාච්ඤා කිරීමෙන් අනතුරුව ඉදිරිපත් කිරීම යුගයේ අවශ්‍යතාවකි. හැකි තරම් තමන්ද දේශනය ජීවත් කරවමින් තම ජීවිත අත්දැකීම් ජනතාවගේ ආධ්‍යාත්මික ජීවිතයට ආලෝකයක් හා ශක්තියක් වන අයුරින්, කල්පනාකාරීව අත්වැලක් කරදීම සැබැවින්ම කිතුනුවන්ට පමණක් නොව අන් ආගමික බැතිමතුන්ටද සැනසීමක් වනු නියතය. එය ධර්ම දානයකි.

**සංස්කාරක පියතුමා**

# සම්බූ කෙත සරු කළ රුවන්පුර එඬේරාණනී ....



සිල්වෙස්ත්‍රෝ බෙනදිකාන නිකායක අති උතුම් ක්ලීටස් චන්ද්‍රසිරි පෙරේරා හිමිපාණන් රදගුරු පදවියෙන් ඉසුඹු (විශ්‍රාම) ලබන්නට දින ළං වෙද්දී වසර 17 ½ ක් පුරා රත්නපුර රදගුරු වසමට මෙන්ම සමස්ත කතෝලික සසුනට කරන ලද දූත මෙහෙවර අගයමින්, සරල චාම් දිවි පෙවතක් හරහා සැබෑ එඬේරකු වූ, ආදර්ශවත් මිණි පහනක් වූ ඔබ වහන්සේට අපගේ භක්ති ප්‍රණාමය සහ කෘතවේදිත්වය පළ කරමු. එය ජනතා හද සන්තානයේ අමරණීය වී ඇත.

ඔබ වහන්සේගේ විශ්‍රාම දිවිය නිදුක් නීරෝග සුවයෙන් සතුටින් ගත කරන්නට දේව ආශීර්වාදය ප්‍රාර්ථනා කරමු. යාච්ඤා කරමු.

## රත්නපුර පදවියේ සිව්වන රදගුරුතුමා වන
## අති උතුම් දේවධර්මාචාර්ය ඇන්ටන් වයමන් කෲස් මාහිමිපාණෝ



හලාවත රදගුරු වසමේ කෝට්ටපිටිය ග්‍රාමයේ නිකලස් පීටර් කෲස් (සගසැපත්) සහ මරියා ප්‍රැන්සිස්කා මිරැන්ඩා යන යුවලගේ එකම පුතණුවන් වන ඇන්ටන් වයමන් කෲස් දරුවා 1967 නොවැම්බර් 8 දා මෙලොව එළිය දිටීය. එකම බාල සොහොයුරියගේ වැඩිමල් සොහොයුරාය. කෝට්ටපිටිය රෝ.ක., කරුක්කුපොනේ රෝ.ක. විද්‍යාලවලින් සහ හලාවත සා. බර්නඩෙත් මහ විද්‍යාලයෙන් තම මූලික අධ්‍යාපනය ලබා ගත්තේය. මාරවිල සාන්ත පාවුලු කනිටු දෙව්සත්හල, අම්පිටිය අප ස්වාමිදූගේ ජාතික දෙව්සත්හලෙන් දර්ශනවාදය සහ දේවධර්මය උපාධි ලබා 2000 සැප්තැම්බර් මස 16 දා හලාවත ආසන දෙව්මැදුරේදී ස්වර්ගස්ථ වූ අති උතුම් ප්‍රැන්ක් මාකස් ප්‍රනාන්දු එවකට හලාවත පදවි එඬේරාණන් විසින් වයමන් සහෝදරතුමන්ට පූජකවරය දානය කරන ලදී. තලවිල සා. ආනා සිද්ධස්ථානයේ සහායක පියතුමකු ලෙස සේවය කළ මෙතුමා මාම්පුරිය මීසම් සේවක පියතුමන් ලෙස පත්වී අභියෝග රාශියක් මධ්‍යයේ තම දූත සේවාව 2001 සිට 2009 දක්වා දියත් කළේය. අනතුරුව ජෝසප් වාස් දහම් සේවා මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ ලෙසද, කට්ටකඩුව සා. ප්‍රැන්සිස් සේවියර් දෙව්මැදුරේ මීසම් සේවක ලෙස 2010 සිට 2011 දක්වා කටයුතු කළේය. උසස් අධ්‍යාපනය සඳහා 2011 ඉතාලියේ නාපෝලි නුවරට ගියේය. එහිදී එඬේරික දේව ධර්මය සහ ක්‍රිස්තු වේදය උපාධි ලබා ගත්තේය. ඒ කාලයේදී ඉතාලියේ වෙසෙන ශ්‍රී ලාංකියනට උපාධ්‍ය පියතුමකු ලෙසද සේවය කර යළි දිවයිනට පැමිණෙන අප පියතුමා 2015 සිට 2019 දක්වා හලාවත පදවියේ කරිටාස් අධ්‍යක්ෂ ලෙස තම දූත මෙහෙවර කළේය. 2019 පටන් හලාවත පදවියේ වතුපරිපාලක පියතුමා වශයෙන් වසර කීපයක් සේවයේ නිරත වෙමින් සිටියදී 2024 මාර්තු 05 දා රත්නපුර පදවියේ සිව්වන රදගුරුතුමන් ලෙස ෆැන්සිස් ශුද්ධෝත්තම පියතුමා විසින් ප්‍රකාශයට පත් කරන ලදී. එතුමාගේ රදගුරු අභිෂේක පදවි ප්‍රාප්ති දේව වන්දනා මෙහෙය 2024 ජූනි 01 වන සෙනසුරාදා, උදෑසන 9.30 ට අවිස්සාවේල්ල, මාදොල, රත්නපුර රදගුරු නිවසේ සිදුකරන්නට නියමිතය.

ලක්ෂ 19 ක් පමණ ජනගහනයක් වෙසෙන රත්නපුර පදවියේ කතෝලික බැතිමතුන් 18000 ක් පමණ වේ. නවක රදගුරුතුමන්ගේ නිලයේ ආදර්ශ පාඨය වන "ප්‍රේමයෙන් සත්‍යය ප්‍රකාශ කරමු" (එපීස 4:15) යන්න සාක්ෂාත් කරමින්, කතෝලික බැතිමතුන්ට සැබෑ එඬේරකු වන්නටද, සෙසු ආගමික ප්‍රජාවගේ අවශ්‍යතාවලට සංවේදී වෙමින් සහජීවනය ගොඩ නඟන්නට අවැසි දේව ආසිරි වැසිමෙන් නිරන්තරයෙන් වසීවා යැයි අති ගරු ඇන්ටන් වයමන් කෲස් හිමිපාණන්ට භක්ති ප්‍රබෝධන සංස්කාරක පියතුමා ඇතුළු කාර්ය මණ්ඩලය, ලේඛක සහ පාඨක සියලු දෙනාගේ ශුභාශිංසන හද බැතින් පුද කරමු, යදිමු මේ පින්බර දිනයේ.

බොහෝ තොරතුරු ලබා දීම
ගරු ඩී. එෆ්. මැදගොඩ පියතුමා

# සාන්තුවර මංගල්‍ය සම්ප්‍රදායේ සුලමුල සහ දේව ධාර්මික හරය



## ප්‍රවේශය

බහුතරයක් කතෝලිකයන් නොවරදවා ම පල්ලි යන දින තුනක් තිබේ. ඒ නත්තල් දිනය, මහ සිකුරාද දිනය සහ පල්ලියේ මංගල්‍ය දිනය යන දින තුන යි. සාමාන්‍ය ඉරුදිනවල හි දී, දිව්‍ය සත්ප්‍රසාද මංගල්‍යයේ දී, බව්තිස්මයක දී, පළමුවර දිව්‍ය සත්ප්‍රසාද ලැබීමක දී, අභිවෘද්ධි ආලේපය ලැබීමක දී, විවාහයක දී හෝ අවමඟුල් අවස්ථාවක දී දේවස්ථානවල හි දක්නට ලැබෙන්නේ සුළුතරයක් යැ යි අවබෝධ කර ගැනීම තරමක් සිත් රිදෙන කාරණයක් විය හැකි වුව ද යථාර්ථය එය යි. යෝජිත ප්‍රස්තුතය ලේඛකයාට ඇරියුම් කරන්නේ ඉහත සඳහන් දින තුනෙන් එකක් වන නාම සාන්තුවර මංගල්‍යය පිළිබඳ තරමක ගැඹුරු අධ්‍යයනයකට පාඨකයා ප්‍රවේශ කරවීමට යි. සමස්ත කිතුනු ප්‍රජාව අතරේ කතෝලික කිතුනුවන් විශේෂයෙන් කැපී පෙනෙන සහ නිර්දය ලෙස විවේචනයට ලක්වන කාරණය ලෙස සාන්තුවර බැතිය අවිවාදයෙන් පිළිගත හැකි ය. මූලධර්මවාදී කිතුනුවන් කතෝලිකයන් කෙරෙහි දැඩි පිළිකුලක් දක්වන්නේ මේ අරබයා ය. එහෙත් කතෝලිකයන් මේ සම්ප්‍රදය අත්හරින බවක් නම් පෙනෙන්නට නැත. ඇත්තෙන් ම බොහෝ තැන්වල එය පෙරටත් වඩා උත්සවශ්‍රීයෙන් සහ උද්දාමයෙන් සමරනු දක්නට ලැබේ. අභියෝග දැඩිවෙද්දිත් මේ තරම් ජීවලිතව සාන්තුවර මංගල්‍ය සිදුකරන කතෝලිකයන් ඒ සම්ප්‍රදයේ සුලමුල දන්නවා ද යන වග නම් සැක සහිත ය. එබැවින් මේ ලිපිය සාන්තුවර සැමරුම්වල යටගියාව දිගහැර දක්වමින්, එහි දේව වන්දනාත්මක බව සහ දේව ධාර්මික බව ඉස්මතු කරන්නට උත්සහ දරයි.

## නාම සාන්තුවර බැතියේ යටගියාව

1889 ජුනි මස 29 දින ප්‍රකාශයට පත් වූ සේක්‍රඩ් හාට් රිවීව් හි(Sacred Heart Review, Volume 2, Number 5), සඳහන් පරිදි දේවස්ථාන කැප කිරීම අපෝස්තලික යුගයේ සිට ම පැවත එන සිරිතක් විය. එය නෛතිකව ස්ථාපනය කරන ලද්දේ ක්‍රිස්තු වර්ෂ 112 දී ප්‍රාණ පරිත්‍යාගි වූ එවරිස්තුස් පාප් වහන්සේ විසිනි. තවදුරටත් ඒ ලිපිය සඳහන් කරන්නේ දේවස්ථාන කැපකිරීමේ සංවත්සර සැමරීම කොන්ස්තන්තීනු අධිරාජයාගේ කාලය දක්වා ම ඈතට දිව යන බව යි.

කතෝලික විශ්වකෝෂයට අනුව ක්‍රිස්තු වර්ෂ 1150 සිට 1642 කාලය අතරතුර සිදු කරන ලද ණය මංගල්‍ය දින පිළිබඳ විස්තරයක් සොයා ගත හැකි ය. ඇත්තෙන් ම මේ දත්ත අඩංගු වන්නේ 1140 පමණ සම්පාදනය වූ, සාසන නීති පද්ධතියේ පියා ලෙස බොහෝ දෙනා පිළි ගන්නා, බෙනදිකාන තාපසවරයකුව සිටි ග්‍රේෂන් නමැති සාසන නීති විශාරදයාගේ නියමයෙහි ය (Decretum Gratiani, also known as the Concordia Discordantium Canonum). එක් එක් රදගුරු වසමේ නාම සාන්තුවර සැමරුමට අමතරව මේ කෘතියේ මංගල්‍ය 41 සඳහන් කර තිබුණි. ඉන් පසුව, 1233 දී පමණ බලාත්මක කරන ලද, නව වන ග්‍රෙගරි පාප් වහන්සේගේ නියමයන්ට අනුව, පවත්වන්නට නියම කරන ලද මංගල්‍ය සංඛ්‍යාව 45 දක්වා වැඩි වී තිබුණි. එහෙත් 1642 දී අටවන උර්බානු පාප් වහන්සේ උනිවේර්සා පෙර් ඕර්බෙම් හෙවත් ලෝකය තුළින් විශ්වය නම් ශුද්ධෝත්තම පිය සන්නස මඟින් (Universa Per Orbem Papal Bull (Universe through the World) මංගල්‍ය සංඛ්‍යාව 35 දක්වා අඩු කළ බව පෙනේ. එහෙත් මේ 35 ට එක් එක් රදගුරු වසම්වල ප්‍රධාන නාම සාන්තුවර සැමරුම් ද එකතු කරන ලදි. මේ නාම සාන්තුවර මංගල්‍ය ඒ සමයේ දී ණය මංගල්‍ය තත්ත්වයෙන් සමරනු ලැබුණු බව දැන ගැන්ම ඉතා වැදගත් ය. ඒ නිසා මේ මංගල්‍ය සැමරුම් වටා අත්‍යලංකාරයෙන් සහ නානාත්වයෙන් පිරිපුන්, ඒ ඒ ජන කොටස්වල සැමරුම් සම්ප්‍රදය ද එකතු විය. සැරසිලි, පෙරහැර, විවිධ කෑම බීම යනාදිය ඒ අතුරින් ප්‍රධාන විය. 16 වන සියවසේ දී ශ්‍රී ලංකාවට

කතෝලික ධර්මය යුරෝපීය සම්ප්‍රදායවලින් අනූනව පිවිස අවස්ථාවේ අප ජනතාවට උරුම වූයේ ද එවැනි මංගල්‍ය සම්ප්‍රදයක් බව සිහිපත් කළ යුතු ය.

ඉන් පසුව සිදු වූ ප්‍රධාන ම සංශෝධනය හමුවන්නේ දෙවන වතිකාන කතිකාවෙන් පසුව ය. මේ සංශෝධන පාදක වන්නේ දෙවන වතිකාන කතිකාවතේ වේද සත්‍ය ව්‍යවස්ථාව වන සක්‍රොසාන්ක්තුම් කොන්චිලියුම් හි අංක 13 මත ය. භක්ති අභ්‍යාස වැදගත් බවත් ඒවා දේව වන්දනා වසරේ නිසි ස්ථානයේ රඳවා ගත යුතු බවත්, ඒවා කිසි විටකත් දේව වන්දනා ක්‍රියා අබිබවා නොයා යුතු බවත් එහි සඳහන් වෙයි.

1969 දී දේව වන්දනා වසර සම්බන්ධයෙන් පොදු න්‍යාය පද්ධතිය ප්‍රකාශයට පත් විය. විශ්ව සභාවට ම පොදු සැමරුම්වලට අමතරව එක් එක් දේශයට සහ රදගුරු වසමට අයත් සැමරුම් පිළිබඳව ද එහි සඳහන් කර තිබේ. එහි අංක 52 හි මෙසේ සඳහන් වේ.

අංක 52 - එක් එක් ප්‍රත්‍යක්ෂ සභාවට අදාළ දේව වන්දනා සැමරුම් සකස් කෙරෙන්නේ විශ්ව සභාවේ දේව වන්දනා ලිත ට දේශීය සැමරුම් ඇතුළු කිරීමෙනි. එහි දී ගාම්භීර්ය සැමරුම්, මංගල්‍යයන්, අනුස්මරණයන් වශයෙන් ඒ සැමරුම් වර්ගීකරණයක් සිදු කෙරේ. ඉතා වැදගත් කාරණය වන්නේ කිසියම් දේවස්ථානයක නාම සාන්තුවර සැමරුම ඒ දේවස්ථාන මීසම් සංඝයට ගාම්භීර්ය සැමරුමක් (Solemnity) ලෙස සලකනු ලැබීම යි. විශ්ව නාම සාන්තුවර ලිතේ ගාම්භීර්ය සැමරුමක් ලෙස ප්‍රකාශයට පත් නොකරන ලද සාන්තුවර මංගල්‍යයක් වුව ද මේ අනුව මීසමක නාම සාන්තුවර මංගල්‍යකදී සලකනු ලබන්නේ ගාම්භීර්ය මංගල්‍යයක් ලෙස ය.

2001 වසරේ දෙසැම්බර් මාසයේ දී ප්‍රකාශයට පත් කෙරුණු The Directory on Popular Piety and Liturgy හෙවත් භක්ති අභ්‍යාස සහ දේව වන්දනාව පිළිබඳ නිර්දේශය අපගේ අවධානයට අනිවාර්යයෙන් ම ලක්විය යුතු ලේඛනයකි. එය දෙවන වතිකාන කතිකාවේ දැක්වෙන ධර්ම ප්‍රතිපත්තිය සනාථ කරන අතර ප්‍රායෝගික කාරණා පිළිබඳ විස්තර ගෙන හැර දක්වයි.

අපගේ මාතෘකාවට බෙහෙවින් අදාළ වන්නේ මේ නිර්දේශයේ පස්වන සහ හයවන පරිච්ඡේද යි. පස්වන පරිච්ඡේදය සම්පූර්ණයෙන් ම වෙන්කර ඇත්තේ දේව මාතාවන් වහන්සේගේ බැතිය පිළිබඳ දීර්ඝ මග පෙන්වීමක් සඳහා යි. හයවන පරිච්ඡේදයේ සාන්තුවර බැතිය පිළිබඳ පොදු ප්‍රතිපත්ති ඉදිරිපත් කෙරේ. අනතුරුව දේව දූතයන්ට, සාන්ත ජුසේ මුනිතුමන්ට, සාන්ත ස්නාවක ජුවාම් මුනිතුමන්ට වැනි සාන්තුවරයන්ට සිදු කෙරෙන බැතිය පිළිබඳ කරුණු ඉදිරිපත් කර ඇත.

සමස්තයක් ලෙස ගත් කල රෝමානු සභාවේ සහ සෙසු රෝමානු කතෝලික ප්‍රත්‍යක්ෂ සභාවල සාන්තුවර බැතියේ ආරම්භය ප්‍රධාන වශයෙන් ම පාදක වන්නේ ප්‍රාණපරිත්‍යාගි සාන්තුවර බැතිය මත ය. ඉහත නිර්දේශයේ අංක 227 සඳහන් කරන පරිදි ප්‍රාණපරිත්‍යාගි බැතිය රෝමයට පමණක් සීමා නොවී ය. උදාහරණ ලෙස, පස්වන සියවසේ සිරියානු ප්‍රාණපරිත්‍යාගි නාමාවලිය, හයවන සියවසේ හියෙරොනිම්ආනුම් ප්‍රාණපරිත්‍යාගි නාමාවලිය, අටවන සියවසේ සාන්ත බීඩ් ප්‍රාණපරිත්‍යාගි නාමාවලිය, නව වන සියවසේ ලියොන් ප්‍රාණපරිත්‍යාගි නාමාවලිය, නව වන සියවසේ උසාර්දේ ප්‍රාණපරිත්‍යාගි නාමාවලිය සහ නව වන සියවසේ අදෙන් ප්‍රාණපරිත්‍යාගි නාමාවලිය සඳහන් කළ හැකි ය.

1584 ජනවාරි 14 දින, අටවන ග්‍රෙගරි පාප් වහන්සේ රෝමානු ප්‍රාණපරිත්‍යාගි නාමාවලියේ මුල් පිටපත ප්‍රකාශයට පත් කළ සේක. 2001 ජූනි මස 9 දින සාන්ත දෙවන ජුවාම් පාවුලු පාප් වහන්සේ රෝමානු ප්‍රාණපරිත්‍යාගි නාමාවලියේ අපර වතිකාන සංස්කරණය ප්‍රකාශයට පත් කළ සේක. මේවායින් පැහැදිළි වන්නේ කතෝලික සභාව තුළ දක්නට ලැබෙන සාන්තුවර ජීවිතවල දැවැන්ත පොහොසත්කම සහ විශාලත්වය යි.

ප්‍රාණපරිත්‍යාගි සාන්තුවරයන්ට අමතරව විවිධ දේශවල හි සභාව ආරම්භ කර, බෙහෙවින් පරිත්‍යාගශීලිව සහ යාගිකව ඒවා මෙහෙයවූවන්, එක් එක් සභා වල ජීවත් වූ සාන්තුවර පූජාප්‍රසාදි, පැවිදි සහ ගිහි ජනතාව වැනි අයගේ බැතිය

සහ විවිධ තැන්වල ඉදි කෙරුණු ප්‍රධාන ආසන දෙව්මැදුරුවල සංවත්සර යනාදිය සමග ප්‍රත්‍යක්ෂ සභාවල සාන්තුවර බැතිය පැතිර ගියේ ය.

මේ අනුව අපේ මීසමේ මංගල්‍යයන් ගැන කතා කරන්නට පෙර සාන්ත සභාවේ නාම සාන්තුවර බැතියේ ඉතිහාසය සැකෙවින් හෝ අධ්‍යයනය කිරීම ඉතා වැදගත් බව අවධාරණය කළ යුතු ය.

**නාම සාන්තුවර බැතිය හා බැඳුණු නිල නිර්දේශ සහ දේව ධාර්මික ප්‍රතිපත්ති**

පහත සඳහන් කාරණා සියල්ල උපුටා ගෙන තිබෙන්නේ 2001 නිකුත් කරන ලද භක්ති අභ්‍යාස සහ දේව වන්දනාව (The Directory on Popular Piety and Liturgy) නම් නිර්දේශය මත ය.

01 සාන්තුවර බැතිය අපගේ විශ්වාසය ගැඹුරු කරන්නට උපකාර වෙයි. එය පාරභෞතික ලෝකෝත්තර බවකට අප කැඳවයි.

02 සාන්තුවර බැතිය වටා එක් රැස්වන සහෘද ජනතාව හේතුකොට ගෙන, ඒකාකාරී ජීවිත සන්දර්භයක සිරවී සිටින බොහෝ දෙනාට මෙය යහපත් සාංඝික අත්දැකීමක් බවට පත් වෙයි.

03 සාන්තුවර බැතිය ආගමික මෙන්ම මානුෂික අවශ්‍යතා කෙරෙහි සෘජු බලපෑමක් ඇති කරයි.

04 කතෝලිකයන්ට විශේෂ වන සාන්තුවර සමෝස ධර්මලාභයේ අත්දැකීම අප වෙත සෘජුවම විවර කරන අත්දැකීමක් ලෙස සාන්තුවර බැතිය නම් කළ හැකි ය.

05 සාන්තුවර බැතිය අතිශයෝක්තියෙන් සිදුවන කල ගැලවීමට සම්බන්ධ ප්‍රධාන අභිරහස් සැමරුමට එය බාධාවක් විය හැකිය. අපර දෙවන වතිකාන සාන්තුවර නාමාවලියේ සංශෝධනවල ඇතැම් සාන්තුවර සැමරුම් සීමා කරන ලද්දේ ද මේ නිසා ය (අංක 228 බලන්න). එබැවින් විශ්වාසකයන්ගෙන් සාන්ත සභාව අපේක්ෂා කරන්නේ ක්‍රිස්තු සමිඳාණන් වහන්සේගේ ගැලවීමේ අභිරහස සහ සාන්තුවර බැතිය පිළිබඳ පැහැදිලි අවබෝධයක් ඇතිව කටයුතු කරන ලෙස යි. ඇත්තෙන් ම සාන්තුවර මංගල්‍යයන් සාන්ත සභාව දකින්නේ ශුද්ධාත්මික ක්‍රිස්තු දේහයේ අවයව වන අප විසින්, එහි හිස වන ක්‍රිස්තු සමිඳාණන්ගේ ම මංගල්‍ය සැමරීමක් ලෙස යි(අංක 229/1 බලන්න).

06 වඩා වැදගත් සාන්තුවර සැමරුම් තීරණය කිරීමේ දී සාන්ත සභාව අනුගමනය කරන එක් ප්‍රධාන ප්‍රතිපත්තියක් වන්නේ ක්‍රිස්තු සමිඳාණන් වහන්සේගේ ජීවිතයට සහ ගැලවීමේ ඉතිහාසයේ කිසියම් විශේෂ මෙහෙවරකට සෘජුව දායක වූ සාන්තුවර සාන්තුවරියන් ඉස්මතු කර දැක්වීම යි. උදාහරණයක් ලෙස, දේව මාතාවන් වහන්සේ, සාන්ත ස්නාවක ජුවාම් මුනිතුමා, සාන්ත ජුසේ මුනිතුමා, සාන්ත පේදුරු සහ පාවුලු අපෝස්තුලුවරු ඇතුළු අනික් අපෝස්තුලුවරු, සාන්ත මරිය මග්දලේනා මුනිවරිය, සාන්ත ස්තේපන් මුනිතුමා වැනි අය. එමෙන් ම, මෙවැනි ප්‍රධාන සාන්තුවර බැති සම්ප්‍රදාය දිරිමත් කිරීමේ දී සාන්ත සභාව අවධානයට ගන්නා තවත් කරුණක් වන්නේ ඒ සාන්තුවර චරිත කොතරම් විශ්වීය මට්ටමෙන් වැදගත් වන්නේ ද යන කාරණය යි. උදාහරණ ලෙසල සාන්ත තෝමස් ඇක්වයිනස් මුනිතුමා, සාන්ත අගුස්තීනු මුනිතුමා, සාන්ත දෙමිනික් මුනිතුමා, අසීසියේ සාන්ත ෆ්‍රැන්සිස් මුනිතුමා, ලීසියෙ හි සාන්ත තෙරේසා මුනිතුමිය වැනි අය. මෙ නයින් බලන කල කල්කටාවේ සාන්ත තෙරේසා මුනිවරිය ශ්‍රී ලංකාවේ සාන්ත ජුසේ වාස් මුනිතුමන්ට වඩා විශ්වීය බවකින් සැලකෙන සාන්තුවරියක් බව අවබෝධ කර ගැනීම අපහසු නැත.

07 එමෙන් ම තමන්ගේ දේශීය සභාවල විශේෂ කාර්යභාරයක් ඉටු කළ හෝ ඒ දේශීය සභාවල ආරම්භයට හෝ පුනරුදයට හෝ බෙහෙවින් දායක වූ සාන්තුවරයන් පිළිබඳව විශේෂ බැතියක් ද සාන්ත සභාව දිරිමත් කරන්නී ය. උදාහරණ - ශ්‍රී ලංකාව තුළ සාන්ත ජුසේ වාස් මුනිතුමා (අංක 229/2) බලන්න).

08 ඒ අනුව සාන්තුවර මංගල්‍ය වර්ගීකරණයක්

රෝමානු සාන්තුවර නාමාවලියේ දක්නට ලැබේ. ඇතැම් සාන්තුවරයන් සහ සාන්තුවරියන් ගාම්භීර්ය සැමරුම් වේ. ඇතැම් සාන්තුවර සැමරුම් මංගල්‍ය ලෙස සැලකේ. ඇතැම් සැමරුම් අනිවාර්ය වේ. ඇතැම් සැමරුම් අනිවාර්ය නොවේ. (Solemnity, Feast and Memorial (obligatory or optional).

09 සාන්තුවර සැමරුම් දේව වන්දනා වසරට අනුකූලව සිදු විය යුතු ය. උදාහරණ ලෙස, චතාරිකයේ, උත්ථාන සමයේ, ආගමනයේ සහ නත්තල් සමයේ සිදු කෙරෙන මංගල්‍ය පිළිබඳව දේව වන්දනා වසර නිකුත් කරන නිර්දේශ අනුගමනය කළ යුතු ය. එවැනි ඇතැම් මංගල්‍ය සාමාන්‍ය සමය වෙත ගෙන ඒමේ හැකියාව මීට නිදසුනකි.

10 නාම සාන්තුවර මංගල්‍ය අවස්ථාවල දී අපගේ සාන්තුවර චරිතය ඉදිරිපත් කරන ආකාරය ගැන අවධානය යොමු කරන ලෙස අංක 231 නිර්දේශ කරයි. එහි දී ප්‍රධාන පරමාර්ථය විය යුත්තේ සාන්තුවරයා හෝ සාන්තුවරිය හෝ දේවත්වයට නංවාලීම නොවේ. මෙහි දේව ධාර්මික පරමාර්ථය විය යුත්තේ සාන්තුවර ජීවිත ආදර්ශය ඇසුරෙන් දෙවියන් වහන්සේ මහිමයට පත් කිරීම යි. එමෙන් ම ඒ උතුමන්ගේ ජීවිතාදර්ශය අනුව ක්‍රිස්තු අභිධර්මය ජීවත් කිරීමේ අභිලාෂය යි. එබැවින් දේව වන්දනාත්මකව නාම සාන්තුවර මංගල්‍යයට සූදානම්වන කාලයේ දී නාම සාන්තුවරයාගේ ජීවිතය නිවැරදිව ඉදිරිපත් කරමින්, ඒ සාන්තුවරයාගේ සාක්ෂ්‍ය දැරීම්, ඒ සාන්තුවරයාගේ යාච්ඤා මැදහත්කම තුළින් සිදු කෙරුණු අරුම පුදුම ක්‍රියා, සුව කිරීම් යනාදිය පැහැදිලි කරමින්, ඒ සාන්තුවරයාගේ ජීවිතයේ සුවිශේෂිත චරිත ලක්ෂණ හෝ ධර්මදූත සේවාවේ විශේෂ ලක්ෂණ ගෙන හැර දක්වමින්, අපට ද දෙවියන් වහන්සේ මහිම පත් කරන්නට ඉන් කෙබඳු අනුප්‍රාණයක් ලබා ගත හැකි දැයි පැහැදිලි කළ යුතු ය.

11 අංක 232 පැහැදිලි කරන්නේ සාන්තුවර මංගල්‍ය අවස්ථා හා බැඳෙන මානව සහ සමාජීය ලක්ෂණ පිළිබඳව ය. මෙවැනි අවස්ථා සැදැහැවතුන්ගේ සැබෑ මානුෂක අවශ්‍යතාව ඉස්මතු කරන්නට සමත් වෙයි. එමෙන් ම ජීවිතයේ විවිධ අරගල අතරේ මනුෂ්‍යයා දෙවියන් වහන්සේ සහ ලෝකෝත්තර ජීවිතය කෙරෙහි දක්වන බැඳීම ද මෙ නයින් පැහැදිලි වෙයි. ඒ අනුව මනුෂ්‍යයා ස්වභාවයෙන් ම සැබෑ සන්තුෂ්ටිය සොයා යන්නකු බව ද පැහැදිලි වෙයි. එමෙන් ම සංස්කෘතික පැතිකඩකින් මේ දෙස බලන විට පෙනී යන්නේ මෙවැනි සතුටුදායක අවස්ථා මනුෂ්‍යය වර්ගයාගේ විශේෂ සංස්කෘතික ජනශ්‍රැතී ඉස්මතු කරන අවස්ථා බව යි. තව ද සමාජීය දැක්මකින් බලන කල පෙනී යන්නේ මෙවැනි සැමරුම් වටා පවුල් එකමුතුවීම සහ අලුත් සබඳතා ගොඩ නැගෙන බව යි.

12 සාන්තුවරයන්ගේ මංගල්‍ය සමරන අවස්ථාවල වුව ද ස්වර්ගීය සාන්තුවර සමූහය සමග සාංඝික වන්නට අපට හැකියාව ලැබෙන විශේෂ මොහොත වන්නේ දිව්‍ය පූජාවට සිදු කරනු ලැබීම යි. එවැනි අවස්ථාවල දී දේව වාක්‍ය ප්‍රකාශනයෙන් පුරාණ ගිවිසුමේ දිවැසිවරු, වීරවරු වැනි අයගේ සාන්තුවර බව ඉස්මතු කෙරෙන අතර, නව ගිවිසුමේ ප්‍රකාශනවලින් අපෝස්තලුවරුන්ගේ සාන්තුවර ධර්මදූතිකබව ඉස්මතු කෙරේ. සමරනු ලබන සාන්තුවරයා හෝ සාන්තුවරිය හෝ ශ්‍රී සුබාරංචියේ සාන්තුවර ගතිලක්ෂණ ඉස්මතු කරන ආකාරය මෙනෙහි කරන්නට මේ දේව වාක්‍ය කොටස් උපකාරී වේ (අංක 234 බලන්න).

13 සියලු සාන්තුවර ප්‍රාර්ථනාව හෙවත් සියලු සාන්තුවර යාදින්න හත්වන සියවසේ සිට සාන්ත සභාවේ භාවිතයේ පවතින්නකි. පාස්කු පූර්ව රාත්‍රී දේව වන්දනා පිළිවෙතේ දී බව්තිස්ම තටාකය ආසිරි ගන්වන අවස්ථාවල දී, බව්තිස්මය දානය කරන අවස්ථාවල දී, තේවාචාර්යවරය, පූජාප්‍රසාදිවරය සහ රදගුරුවරය දානය කරන අවස්ථාවල, පැවිදි සදාතන වේද භාර අවස්ථාවල දී, දේවස්ථානයක් කැපකිරීමේ දී, පූජාසනයක් කැප කරන අවස්ථාවලදී වැනි, සාන්ත සභා ජීවිතයේ සුවිශේෂ අවස්ථාවල දී මෙම යාදින්න භාවිත කෙරේ. මේ යාදින්න තුළ දේව වන්දනාමය මූලාශ්‍රවලින් සහ භක්ති

අභ්‍යාස සම්ප්‍රදායේ මූලාශ්‍රවලින් උපුටා ගන්නා ලද කාරණා අඩංගු වන අතර සාන්තුවරයන් අප වෙනුවෙන් දෙවියන් වහන්සේ ඉදිරියේ යාච්ඤාවෙන් මැදහත්වන බව ද ඒ භක්ති සම්ප්‍රදාය නිසා වන්දනා ගමනක නිරත සාන්ත සභාව සහ ස්වර්ගීය ජෙරුසලෙම අතර සබැඳියාව තහවුරු කෙරෙන බව ද පැහැදිලි වෙයි (අංක 236 බලන්න).

14 සාන්තුවරයන්ගේ ශුද්ධ ධාතු ගෞරවය ද කතෝලික සභාවේ දක්නට ලැබේ. සාමාන්‍යයෙන් මේ ධාතු තුන් ආකාරයකට වර්ගීකරණය කෙරේ. පළමුවෙන් ම හමුවන්නේ ශුද්ධවන්තයන්ගේ හෝ ශුද්ධවන්තියන්ගේ හෝ සිරුරු හෝ සිරුරු කොටස් ය. දෙවනුව හමුවන්නේ ඒ සාන්තුවරයින් පෞද්ගලිකව භාවිත කළ දේවල් ය. උදාහරණ ලෙස, ඔවුන්ගේ ඇඳුම් පැළඳුම්, ඔවුන්ගේ ඇස් කණ්ණාඩි, පෑන්, පැන්සල් යනාදිය යි. තෙවනුව හමුවන්නේ ඔවුන්ගේ සිරි සිරුරුවල ස්පර්ශ වූ හෝ ස්පර්ශ කරවන ලද තෙල් වර්ග, රෙදි වර්ග වැනි දේවල් ය (අංක 236 බලන්න). සාන්තුවරයින්ගේ ධාතු දිව්‍ය පූජා පූජාසන මත තැන්පත් කිරීම රෝමානු දිව්‍ය පූජා සංග්‍රහය සනාථ කරයි (දිව්‍ය පූජා සංග්‍රහයේ අංක 302 බලන්න). මින් අදහස් කෙරෙන්නේ ශුද්ධවන්තයන්ගේ යාගිකවීමේ අරමුණ ක්‍රිස්තු සමිඳාණන් වහන්සේගේ කල්වාරි යාගයට සම්බන්ධවීම බව යි.

15 ශුද්ධවන්තයන් හා බැඳුණු ධාතු ගෞරවය සඳහා ඉදිරිපත් කිරීමට පෙර ඒ ධාතුවල විශ්වසනීයත්වය තහවුරු කළ යුතු ය. ධාතු වැඩි කර ගැනීම පිණිස සාන්තුවර භාවිතයේ තිබුණු රෙදි කැබැල්ලක් වැනි දෙයක් තවදුරටත් කුඩා කැබලිවලට කඩමින් ධාතු සංඛ්‍යාව වැඩිකර ගැනීම කිසිසේත් අනුමත නොකෙරේ. දේව වන්දනා රීතියට අනුව කිසියම් ධාතුවක් පියවි ඇසට සාමාන්‍යයෙන් පෙනෙන තරමේ විශාලත්වයකින් යුක්ත විය යුතු ය (Pontificale Romanum, Ordo dedicationis ecclesiae et altaris, Editio Typica, Typis Polyglotis Vaticanis 1977, cap. IV, Praenotanda, 5). තව ද ශුද්ධවන්තයින්ගේ ධාතු එකතු කිරීමේ ප්‍රවණතාව ද එවැනි ධාතු නීති විරෝධී ලෙස ප්‍රවාහණය සහ අලෙවිය ද අනුමත නොකෙරේ (සාසන නීති සංග්‍රහයේ අංක 1190 බලන්න).

16 සාන්තුවරයන්ගේ ධාතු සිපාචාර කිරීම, ඒවා ඉදිරියේ පහන් දැල්වීම සහ මලින් සැරසීම, ඒවා රැගෙන පෙරහැරේ යාම, ඒවා රෝගීන් වෙත ගෙන යාමෙන් ඔවුන් වෙනුවෙන් ශුද්ධවන්තයන්ගේ යැදුම් පිහිට ප්‍රාර්ථනා කිරීම වැනි භක්ති ක්‍රියා ගෞරවයෙන් සිදු කළ හැකි ය. එහෙත් ශුද්ධවන්තයන්ගේ ධාතු රැගත් කරඬු පූජාසනය මත තැබීමට අවසර නැත (අංක 237 බලන්න). මෙය ශුද්ධවන්තයන්ගේ ප්‍රතිමාවලට ද අදාළ නිර්දේශයකි (අංක 245 බලන්න).

17 ක්‍රිස්තු වර්ෂ 787 දී පවත්වන ලද දෙවන නිසියානු මන්ත්‍රණ සභාවේ දී ගන්නා ලද තීරණයකට අනුව (Definitio de sacris imaginibus) ශුද්ධවන්තයන්ගේ ප්‍රතිමාවලට ගෞරවය දැක්වීම කතෝලික සභාව වර්තමානයේ පවා අනුමත කරන්නී ය. මේ ස්ථාවරය සඳහා පදනම් වන දේව ධාර්මික සාධකය ලෙස ඉදිරිපත් කෙරෙන්නේ ක්‍රිස්තු සමිඳාණන් වහන්සේගේ මාංසගතවීම යි. උන්වහන්සේ අදෘශ්‍යමාන දෙවියන් වහන්සේගේ දෘශ්‍යමාන පිළිරුව වන සේක (කොලොස්සි 1,15). (කතෝලික සභාවේ ධර්මෝපදේශය අංක 1161)(2001 නිර්දේශය අංක 238 බලන්න). එමෙන් ම ශුද්ධවන්තයන්ගේ ප්‍රතිමාවලට ගෞරවය දැක්වීම පිළිබඳව නිසි දේව ධාර්මික මග පෙන්වීම් කළ යුතු වන අතර, ඒ ඇසුරෙන් මේ භක්ති කටයුතුවල දී සිදුවිය හැකි අනිසි ක්‍රියාවන් වැළැක්විය හැකි බව ද 2001 නිර්දේශය පෙන්වා දෙයි (අංක 239 බලන්න). (Council of Nicea II, Definitio de sacris imaginibus (23 October 787); Council of Trent, Decretum de invocatione, veneratione, et reliquiis Sanctorum et sacris imaginibus (3 December 1562), SC 111. කතෝලික සභාවේ ධර්මෝපදේශය අංක 1159-1162).

18 සාන්තුවරයන්ගේ ප්‍රතිමාවලට ගෞරවය දැක්වීමේ කතෝලික ස්ථාවරය මගින් තහවුරු වන්නේ එය ශුද්ධ සුබාරංචියේ ඉකෝනමය නිරූපකයක් බව යි. ඒ ප්‍රතිමා මගින් දෙවියන් වහන්සේගේ අනාවරණය පිළිබඳව කිසියම්

අවබෝධයක් ලබා ගත හැකි බව යි. ඒ නිසා මෙවැනි ප්‍රතිමා දේව වචනයේ අනාවරණයට පටහැනි නොවන ආකාරයෙන් ඉදිරිපත් කළ යුතු ය (අංක 240 බලන්න). එමෙන් ම අවසානයේ ඒ ප්‍රතිමා අපට ගෙනහැර දක්වන්නේ මිනිස් රූප අතික්‍රමණය කරන සහ ශුද්ධවන්තයන්ගේ ජීවිත මගින් මහිමයට පත් කරනු ලබන ක්‍රිස්තු සමිඳාණන්ගේ රූපය ම ය. තව ද මේ භක්ති කටයුත්ත අපගේ යාච්ඤාව සඳහා ද අපට ඉවහලකි. ඒ ශුද්ධවන්තයන්ගේ යාච්ඤා ජීවිත මෙනෙහි කිරීම මඟින් ඔවුන්ගේ යැදුම් පිහිට පැතීමෙන් සහ ඔවුන්ගේ ජීවිත පිළිබඳ ගැඹුරු අවලෝකනයේ යෙදීමෙන් ක්‍රිස්තු සමිඳාණන් වහන්සේ තුළ නව මිනිසුන් බවට පත් වූ ශුද්ධවන්ත පිරිසක් අපගේ ආදර්ශය කර ගැනීමේ අවස්ථාව ද අපට හිමි වෙයි (අංක 240 බලන්න).

19 ඇත්තෙන් ම අප ගෞරවය දක්වන්නේ ප්‍රතිමාවට නොවේ. ඒ ප්‍රතිමාවෙන් පිළිබිඹු වන ශුද්ධවන්ත යථාර්ථයට යි. එබැවින් මෙවැනි ප්‍රතිමා අති උත්කෘෂ්ට දිව්‍යමය තත්ත්වයෙන් ගෙන හැර දැක්වීමේ ප්‍රවණතාව වැළැක්විය යුතු ය. ඒ භක්ති අභ්‍යාස ඇසුරෙන් දෙවියන් වහන්සේ මහිමයට පත්විය යුතු ය (අංක 242 බලන්න). එබැවින් මේවා කලාත්මකව නිර්මාණය කිරීමේ දී පවා කිසියම් විනයක් අවශ්‍ය වේ. පෙරදිග කතෝලික සම්ප්‍රදාය තමන්ගේ ඉකෝන නිර්මාණය පිළිබඳව සවිස්තරාත්මක නිර්දේශ නිකුත් කර ඇත්තේ ද මේ නිසා ය (අංක 243 බලන්න).

20 එමෙන් ම ශුද්ධවන්තයින්ගේ ප්‍රතිමා කිසියම් සාධාරණ හේතුවක් රහිතව ඒවා ස්ථාපිත කර ඇති ස්ථානවලින් ඉවත් කිරීම අනුමත නොකෙරේ. එසේ ඉවත් කිරීමෙන් සැදැහැවතුන්ගේ භක්තියට වන බලපෑම ගැන සාන්ත සභාව අවධානයෙන් සිටින්නී ය (අංක 243 බලන්න).

21 සැදැහැවතුන්ගේ සහභාගිත්වයෙන් පෙරහැර පැවැත්වීම කතෝලික භක්ති අභ්‍යාස ඉතිහාසයේ සිට ම දක්නට ලැබෙන සිදුවීමකි. පෙරහැර පැවැත්වීම ශුද්ධ බයිබලය තුළම අපට හමුවන කාරණය (එසෙකියෙල් 14,8-31 2සාමුවෙල් 6,12-19 1කොරින්ති 15,25-16,3) එබැවින් සාන්ත සභාව විවිධ පෙරහැර අනුමත කරන්නීය. ඉන් පළමුවැන්න ලෙස ක්‍රිස්තු සමිඳාණන් වහන්සේගේ ගැලවීමේ කර්තව්‍යයට සෘජුව ම සම්බන්ධ පෙරහැර දැක්විය හැකි ය. උදහරණ ලෙස ජේසු සමිඳාණන් දේව මාලිගයට පුද දීමේ මංගල්‍යයේ දී සිදු කෙරෙන පෙරහැර (ලූක් 2,22-38). ගොබ් ඉරුදින පෙරහැර (මතෙව් 21,1-10 මාක් 11,1-11 ලූක් 19,28-28 ජුවාම් 12,12-16), පාස්කු පූර්ව රාත්‍රියේ පාස්කු ඉටිපහන රැගෙන යන පෙරහැර, මහ බ්‍රහස්පතින්ද ශුද්ධ තෛලයන් රැගෙන පූජාසනය වෙත පැමිණීමේ පෙරහැර යනාදිය ඉදිරිපත් කළ හැකි ය (අංක 245 බලන්න). ඊළඟ පෙරහැර වර්ගය ලෙස භක්තිය ඇසුරෙන් ශ්‍රද්ධාව තර කිරීම මුල් කොටගත් පෙරහැර ගෙන හැර දැක්විය හැකි ය. මීට උදහරණ ලෙස දිව්‍ය සත්ප්‍රසාද පෙරහැර ගෙන හැර දැක්විය හැකි ය. එමෙන් ම ඇතැම් රටවල නොවැම්බර් මස දෙවන දින දේවස්ථානයේ සිට මිහිදන් ස්ථානය වෙත පෙරහැරෙන් ගමන් කිරීම ද සිදු වන්නේ මේ අදහස යටතේ ය. තෙවනුව අපට හමුවන්නේ ශුද්ධවන්තයන්ගේ ප්‍රතිමාල ඉකෝන යනාදිය ගෞරවය සඳහා සිදු කෙරෙන පෙරහැර ය. එසේ ගෙනයාමෙන් ඒ ශුද්ධවන්තයාට ගෞරවය දැක්වීම පමණක් නොව එමගින් අපගේ විශ්වාසයට ප්‍රසිද්ධියේ සාක්ෂ්‍ය දැරීමට ද අපට අවස්ථාව ලැබෙන බව පැහැදිලි ය. එහෙත් ඇතැම් දේ අතිශයොක්තියෙන් සිදු කිරීමේ අවදානම ගැන ද සාන්ත සභාව අපගේ අවධානය යොමු කරන්නී ය (අංක 246 බලන්න). එබැවින් මේවා පිළිබඳ නිසි දේව ධාර්මික, දේව වන්දනාමය සහ මානව විද්‍යාත්මක ධර්මෝපදේශයක් නිර්දේශ කර තිබේ. දේව ධාර්මික දෘෂ්ටි කෝණයකින් බලන කල පෙරහැර අපට උගන්වන්නේ දේව ජනතාවක් ලෙස අපි නව ජෙරුසලෙම හෙවත් ස්වර්ගය කරා යන වන්දනා නඩයක් බව යි. දේව වන්දනාමය පැතිකඩ ඇසුරෙන් අප දකින්නේ ඒවා දේව ජනතාව එක්රැස් කරන, ඔවුන්ට යාච්ඤාවේ සහ ගීතිකාවේ නිරතවන්නට අවස්ථාව උදා කරන, දෙවියන් වහන්සේගේ මහිමය ශුද්ධවන්තයන් තුළින් දකින්නට මග සලස්වන අවස්ථා ලෙස යි. මානව විද්‍යාත්මක ඇසකින් බලන කල මෙවන් අභ්‍යාස ජනතාවන්ගේ සංස්කෘතික වටිනාකම් එළි දක්වන සහ සමාජයක් ලෙස විවිධ ජාතීන් ආගම්

එකතු කරන අවස්ථා බව සුපැහැදිලි වෙයි.

සමාප්ත සටහන

අපේ මීසමේ වාර්ෂික මංගල්‍යය ඇත්තෙන් ම අපට බොහෝ ආත්මීකව ඵලදායී අවස්ථාවක් කර ගැනීමට ඉහත කාරණා ගැඹුරින් සහ මැනවින් අධ්‍යයනය කර පිළිපැදීම අනිවාර්යයෙන් ම ප්‍රයෝජනවත් වෙයි. එහෙත් තවමත් අප මීසම් බොහෝමයක සිදුවන යහපත් දේ අතර වඩා අවධානයට ලක්වන්නේ ආන්තික කාරණා බව පැවසීම වරදක් නොවේ. බොහෝ තැන්වල මංගල්‍යය පිළිබඳ කෙරෙන පළමු සාකච්ඡාවේ මාතෘකාව වන්නේ කොන්ත කඩ දැමීම, වළං කඩවලින් අය කර ගන්නා මුදල, පෙරහැර යන මාර්ගය, කොඩිගස් කොපමණ ඔසවනවාද යන වග යනාදිය යි. කනගාටුව තවදුරටත් වැඩිවන්නේ දේව වන්දනාමය කාරණාවලට වඩා අතිශයෝක්තියෙන් සහ ඇතැම්විට අනුමත නොකළ ආකාරවලින් භක්ති කටයුතු සංවිධානය කරනු දක්නට ලැබීම යි. මේවා පිළිබඳව සාන්ත සභාවේ නිර්දේශ ගැන දැනුම්වත්වීමට හෝ ඒවා පිළිපැදීමට අකමැති වීම යි. ඒ අනුව බොහෝවිට අප හැසිරෙන්නේ ප්‍රාථමික අංශවල කුඩා ළමයින් හැසිරෙන ආකාරයට යි. ඊටත් ඔබ්බට යන ඇතැම් අය මෙය අවස්ථාවක් කර ගන්නේ කානිවල් සහ සංගීත සංදර්ශන පැවැත්වීමට අවස්ථාවක් කර ගැනීමට යි. එසේ පවත්වන බොහෝ අය ඉරුදිනකවත් දේවස්ථානයට එන අය නොවේ.

කතෝලික සභාව භක්ති අභ්‍යාස පිළිබඳව තම ස්ථාවරය පැහැදිලිව ආරක්ෂා කර ගන්නා නමුදු, එය ප්‍රායෝගික ක්‍රියාත්මක කිරීමේ දී සිදුවන අකටයුතුකම් නිසා, බොහෝ අය මේ සාන්තුවර භක්ති අභ්‍යාස දකින්නේ වැරදි ආකාරයට බව පැහැදිලි ය. එබැවින් සාන්ත සභාවේ නිර්දේශවලට අනුව සාන්තුවර බැතිය පැවැත්විය යුතු ආකාරය, ප්‍රතිමාවලට ගරු කළ යුතු ආකාරය, පෙරහැර පැවැත්විය යුතු ආකාරය, ශුද්ධවන්තයන්ගේ ධාතුවලට ගෞරවය දැක්විය යුතු ආකාරය යනාදිය ගැන දේව ධාර්මික, දේව වන්දනාමය සහ මානව විද්‍යාත්මක ධර්මෝපදේශයක් අනිවාර්යයෙන් ම සිදු විය යුතු ය.

ආචාර්ය ගරු සිසිල් ජෝයි පෙරේරා පියතුමා,
අදියුරු, දහම් සෙවණ දෙව්සත්හල, කළුතර.

# දුප්පතාගෙ දුක නිවන්නා

මංගල්ලෙට ආශාවෙන් දින ගන්නා කැලැන්ඩරේ
එසවුණු කොඩිගස දුටුවම බැතිය පිරෙයි දෙව්දුකෙරේ
දෙව් ආසිරි ලබා දෙන්නා සියලුම ජනතා අතරේ
අප පියනම ඇප කැපවෙයි දිවා රැයේ නිරන්තරේ

දේශක පියතුමා වචනෙ හදවතටම දෙන්නේ
දුප්පතාගෙ දුක නිවන්නා ඒකයි මංගල්‍ය වන්නේ
පසුතැවිලිව එකිනෙකාව සාමෙන් පිළිගන්නේ
ඒවා අහන අපේ අයගෙ වත මිලිනව යන්නේ

සැඳෑ මෙහෙය, මංගල යාගය සමගින් පෙරහැර
නිමවන්නේ
සවස් වෙද්දි අපෙ සමහරු වැටි වැටි ඇවිදින්නේ
විලාසිතා තරඟෙ නිසා පොකට්ටුවත් උණා ගන්නේ
මංගල්ලෙත් ඉවර උනා සුදුවරු හිනැහෙන්නේ

එම්. අයිරින් කොස්තා - කඳවල

# ශාස්තෘවරු සහ ආගම්....

ශාස්තෘවරු සහ ආගම්....
ආගමාභිමානය සහ අන්ධ භක්තිය විසින්
ශාස්තෘගුණය
යටපත් කරනු ලබන්නේ ද ?

ශාස්තෘවරුන්ගේ
ආලෝකය, ශක්තිය සහ සුවය
අප තුළ වගා වුණු පිණිස
ශාස්තෘබැතිය
උපයෝගි කර ගත නොහැකි ද ?

සපුගස්කන්දේ රංජිත්

# ඇතුළාන්ත ජීවිත වෙනසක් වෙත අප ගෙන යන මංගල්ලයක් කරා...!



"මෙදා පාර මංගල්ලය හරි ජයයි"

"මේ අවුරුද්දේ අපේ පල්ලියේ මංගල්ලය කිසි ගතියක් නැහැ"

දේවස්ථානයක වාර්ෂිකව පැවැත්වෙන මංගල්‍යයක් අවසානයේදී සාමාන්‍යයෙන් අපට ඇසෙන වගන්ති දෙකකි ඉහතින් සඳහන් වූයේ. දේවස්ථානයක් කැපකර ඇති ශුද්ධවන්තයාගේ මංගල්‍යයේ සරු නිසරු බව, ජයගතිය, මනින නිර්ණායකයන් මොනවාද?

දේවස්ථානයක් මීසමක් කැපකර ඇති ශුද්ධවන්තයකුගේ ජීවිතය ගැන භාවනා කරමින්, දෙවියන් වහන්සේ වෙත අපට තව තවත් ළංවන්නට ඒ ශුද්ධවන්තයා අපට කෙබඳු ආදර්ශයක් දෙන්නේද යැයි භාවනා කරමින්, වාර්ෂිකව මීසමක හෝ දේවස්ථානයක පවත්වන මංගල්ලය මීසමේ හෝ දේවස්ථානයක සැදැහැවත් ජනතාවට සැබැවින්ම වාසනාවන්ත, භාග්‍යවන්ත අවස්ථාවකි.

තම ජීවිතය ගැන ආපසු හැරී බලන්නට, දේව වචනය ගැඹුරින් මෙනෙහි කරන්නට, යහපත් පාප උච්චාරණයක් කර ගනිමින් දේව වචනය තුළ ගැඹුරු ජීවිත වෙනසක් කරා යන්නට, මංගල්ලය කදිම වාසනාවන්ත, භාග්‍යවන්ත අවස්ථාවකි.

වාර්ෂික ධර්ම විවේකයක් පැවිදි පූජකවරුනට සුලබව ලැබෙන අවස්ථාවක් වුවද, ගිහි ජනතාවට සතියක් එවැනි ධර්ම විවේකයක යෙදෙන්නට, ධර්ම විවේක මධ්‍යස්ථානයකට ගොස්, භාවනාශීලිව ධර්මය හදාරන්නට අවස්ථාව නොමැත. ඒ සඳහා වැය කරන්නට කාලය අවස්ථාව, විවේකය මෙන්ම අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදනද නොමැත. පවුල් ජීවිතයේ දෛනික වැඩකටයුතු හා වගකීම් අතර මෙවැනි ධර්ම විවේකයක් සඳහා විවේකය සොයා ගැනීම උගහටය. එවැනි තත්ත්වයක් තුළ දේවස්ථානයක වාර්ෂික මංගල්ලය ගිහි සැදැහැවත් ජනතාවට සැබැවින්ම වාර්ෂික ධර්ම විවේකයකි. නොවාන සමය තුළ දී දිනපතාම දිව්‍ය යාගයට සහභාගි වී, දේව වචනයට ඇහුම්කන් දී, ඒ දේව වචනය ආශ්‍රිතව සිදුවන මධුර වූ දේශනාවලට සවන් දී, තම ජීවිතය දෙස යථාර්ථවාදිව බලන්නටත්, යහපත් පාප උච්චාරණයක් කර ගනිමින්, පෞද්ගලිකවත්, පවුලක් ලෙසත්, මීසමක පොදු සාංඝික ජනතාවක් ලෙසත්, ජීවිත වෙනසක් කරා පා තබන්නටත් මීසමේ වාර්ෂික මංගල්ලය, වරප්‍රසාදයේ කාලයකි. ධර්ම විවේකයකි. මංගල්ලය සමය තුළදී සිදුවන හා සැදැහැවතුන්ට ලැබෙන විශේෂ වරප්‍රසාදයක් වන්නේ, යහපත් පාප උච්චාරණයක් කරගෙන දෙවියන් වහන්සේගේ කොන්දේසි විරහිත, අපරිමිත ආදරය අත්දැකීමයි.

කරුණු කාරණ කෙසේ වුවද, අභාග්‍යයකට මෙන් අප මීසම් හා දේවස්ථානවල වාර්ෂික මංගල්ලයේ මේ උතුම් අවස්ථාවෙන් ප්‍රයෝජන ගන්නේ සමස්ත ජනතාවගෙන් කීයෙන් කී දෙනාද? බොහෝ දේවස්ථානවල කොඩිගස ඔසවන දිනදී විශාල ජනතාවක් රැස් වුවත්, ඉන් පසු පැමිණෙන නොවානවලට සහභාගි වෙන්නේ කීයෙන් කී දෙනාද? සමහරු "අපේ කොට්ඨාසයේ නොවානයට" පමණක් සහභාගි වෙන්නට පුරුදු වී ඇත. "අද අපේ නුවානෙනේ" අන් නොවාන මීසමේ පියතුමාගේ පමණක් නොවාන බවට පත් වී ඇත. දේශක පියතුමා යැදුම තුළ තෝරාගත් එක තේමාවක් තුළ දිනෙන් දින ජනතාව දහම

තුළ මෙහෙයවා ඉදිරියට ගෙන ගියද, එක දිනක් පමණක් "අපේ නුවානයට" පමණක් හෝ ඉඳ හිට පමණක් නොවානයකට සහභාගි වන අයට එම දේශන මාලාවෙන් ප්‍රයෝජන ලබා ගන්නට නොහැකි වනු ඇත.

මගේ මතය අනුව දින ගණනාවකටම එක දේශක පියතුමකුට ආරාධනා කර, ඒ දේශක පියතුමා මගින් නොවාන සියල්ලම මෙහෙයවීම ඉතා නිවැරදි ක්‍රියාවකි. එක දේශක පියතුමකු නොවාන සමය තුළ මීසමේ රැඳී සිටිමින් දිවා කාලයේ ජනතාවට අවශ්‍ය නම් එතුමාව මුණ ගැසී තම ප්‍රශ්න සාකච්ඡා කරන්නට අවස්ථාව ලබා දී, දේවවන්දනාව මෙහෙය වන්නට උදව් වී, සවස් කාලයේ ක්‍රමානුකූලව සකස් කර ගත් දේශනා මාලාව, දේශනා කිරීම තුළ ජනතාවට මේ නොවාන සමය තුළ ලැබෙන ආත්මික වරප්‍රසාදවල ප්‍රමාණය තක්සේරු කළ නොහැකිය. එහෙත් අභාග්‍යයකට මෙන් දැන් දැන් බොහෝ මීසම්වල මීසම භාර පියතුමන්ලා එවැනි දේශක පියතුමකු ගෙන්වාගෙන දේශනා කරනවා වෙනුවට අහල පහළ මීසම්වලින්, දිසාවෙන් එක එක දවසට විවිධ පියතුමන්ලා ගෙන්වා දේශන කිරීම තුළ මට දැනෙන ලෙස සැදැහැවතුන්ට ලැබෙන ප්‍රයෝජනයක් නොමැතිවා සේය, සමහර පියතුමන්ලා සූදානමකින් තොරව මොනවා හෝ කියන්නට, පෙලඹී සිටි. සමහර විට එකම තේමාව යළි යළිත් දේශනා කරති. "පියතුමා සූදානම් නැති බව" ජනතාවට හැඟේ. සමහර පියතුමන්ලාගේ දේශනා "විකට ජවනිකා" බවට පත් වී ඇත. ජනතාව වැඩියෙන් ගෙන්වා ගන්නට එවැනි විකට දේශකයන්ව ගෙන්වා ගැනීමටද ඇතැම් පියතුමන්ලා පෙලඹී ඇත. ඒනිසා පුහුණුව ලත් දේශක පියතුමකුගේ සේවය ජනතාවට ලබා දීම මීසම භාර පියතුමාගේ වගකීමයි.

අද කාලයේ ජනතාව ආකර්ෂණය කරගනු ලබන බොහෝ රූපවාහිනි වැඩසටහන්, සන්ධ්‍යා කාලයේ විකාශනය වේ. සමහරු මේ වැඩසටහන් වලට හා ටෙලිනාට්‍ය වලට ඇබ්බැහි වී ඇත. එවැනි මොහොතක ජනතාව එවැනි ඇබ්බැහිවීම්වලින් ගලවාගෙන දේවස්ථානයේ නොවානවලට සහභාගි කරවීමට හා දේශන වලට ආකර්ෂණය වන තරමට දේශක පියතුමාගේ දේශනා හා දේවවන්දනාව අර්ථාන්විත විය යුතුය. කාලෝචිත විය යුතුය, ජීවමාන විය යුතුය, අක්‍රියාකාරි, ඒකාකාරි, නිදිමත දැනෙන දේශනාවලට ඇහුම්කන් දෙන්නට අද ජනතාව නොපැමිණෙති.

එනිසාම නොවාන දේශක පියතුමන්ලාගේ වගකීම වන්නේ ඉතාමත් මනරම් ලෙස, යථාර්ථවාදි හා කාලෝචිත ලෙස, දේවධාර්මික ලෙස දේව වචනය ජනතාවට කඩා දීමයි.

මගේ පෞද්ගලික අත්දැකීම වන්නේ, දේශක පියතුමා හොඳ සූදානමකින් පසුව, අර්ථාන්විත ලෙස, දේශනා පවත්වන විට, දිව්‍ය පූජාව මෙහෙය වන විට, දිනෙන් දින, දවසින් දවස, පූජාවට පැමිණෙන අයගේ සංඛ්‍යාව වැඩිවන බවය.

නොවාන සමය, මංගල්ලය සැබැවින්ම ධර්ම විවේකයක් බව පුන පුනා පවසන්නට, තරයේ ප්‍රකාශ කරන්නට මා කැමැතිය. එය එසේ නම් ධර්ම විවේක කාලයේදි තිබිය යුතු නිශ්ශබ්දතාව, නිසලබව, සංහිඳියාව, නිශ්චලතාව, සන්සුන්බව, ශාන්ත බව, නිසොල්මන නොවාන සමය හා මංගල්‍ය කාලයේ දේවස්ථානය තුළ, අවට, පැවතීම ඉතාමත් අත්‍යවශ්‍ය කරුණකි. එහෙත් වත්මනේ හා මෑත අතීතයේ අප ශ්‍රී ලාංකික කතෝලික සභාව තම දේවස්ථානවල වාර්ෂික මංගල්‍යයට සූදානම් වීමේ කාලය ගත කරන ආකාරය දෙස බැලීමේදී, මේ නිහඬබව, සංහිඳියාව, නිසලබව, දේවස්ථානය තුළත්, අවටත්, පොදුවේ මුළු ගම පුරාත් දැක ගැනීම ඉතා අපහසුය. මුළු ගමම එකම "ගාලගෝට්ටියක" ස්වභාවයකි. මුළු ගම පුරාම ශබ්ද විකාශන යන්ත්‍ර සවිකර නොවාන ආරම්භයට පැය කිහිපයකට පෙරත්, පසුත් සමහර දේවස්ථානවල දවස පුරාත්, ගීතිකා ඇතුළු ආගමික වතාවත් ශබ්ද විකාශන යන්ත්‍රවලින් විකාශනය වේ. මෙහිදි අප මතක තබාගත යුතු කරුණක් ඇත. අප කතෝලිකයන් වුවද අප ගම්වල හැමදෙනම කතෝලිකයෝ නොවෙති. සමහර විට අප දේවස්ථාන වල ශබ්ද විකාශන

යන්ත්‍රවලින් මුදා හරින දේ, අන්‍ය ආගමිකයන්ට මහත් වූ කරදරයක්, හිසරදයක් නොවේද? හිතන්න මොහොතක්....! අප ගෙවල් අහල පහළ පන්සලක ශබ්ද විකාශන යන්ත්‍රයකින් දවස පුරා ගාථා හා වෙනත් දෑ ප්‍රචාරය වන්නේ නම්, අපට එය හිසරදයක් හා කරදරයක් නොවේද? අපි ඔවුන්ට බැණ වැදී නැද්ද? අප ගමේ අසනීප වී ඔත්පල වූ වැඩිහිටියෙකු සිටිය හැකිය. විභාගයට පාඩම් කරන දරුවන් සිටිය හැකිය. අපි අපගේ මංගල්ලයේ ප්‍රීතිය වැඩිකර ගැනීම සඳහා සවිකර ඇති ශබ්ද විකාශන යන්ත්‍ර එවැනි වැඩිහිටියකුට දරුවකුට මහා බාධාවක් විය හැක.

නොවානය ආරම්භ කරන්නට කොඩි ගස එසවීමටත් පෙරම කොට්ඨාස හා නොවාන නායකයෝ ගෙයින් ගෙට ගොස් "නුවාන කාසි" එකතු කිරීම ආරම්භ කරති. "ඒ කොට්ඨාසයට වඩා මගේ / අපේ කොට්ඨාසයේ එකතු වුණ මුදල වැඩියි" කියා කියන්නට, "අපේ කොට්ඨාසයේ තමා වැඩිම නුවාන කාසි එකතු කළේ" කියා කියන්නට, කොට්ඨාස නායක, නායිකාවන් අතර තරඟයකි. මීසම භාර පියතුමාද මේ තරඟය යහමින් ප්‍රයෝජනයට ගනී. ඒ නිසා දිනපතාම නොවාන පූජාව අවසානයේ ඒ කොට්ඨාසයේ එකතු වූ මුදල ප්‍රකාශ කරන්නට තරමට පියතුමා ගිණුම් කටයුතු පිළිබඳව වගකියන පුද්ගලයකු බවට (ACCOUNTABLE) පත් වී ඇත. එවිට පසුදා නොවාන කොට්ඨාසය පෙරදා නොවාන කොට්ඨාසයට වඩා රුපියලක් හෝ වැඩියෙන් එකතු කර තරගයේ වීරයා බවට පත් වන්නට උත්සාහ කරති. එය පියතුමාට වාසියකි. එදා වේල කන්නට නැති අයගෙන් පවා බලාත්කාරයෙන් මෙන් නොවාන කාසි, පෙරහැර කාසි, සැරසිලිවලට මුදල්, නොවානවලට වියදම් මුදල් ආදිය එකතු කරති. පල්ලියට තීන්ත ගාන මුදල් එකතු කරති. මෙය අප පල්ලිවලට අයත් දුගී අයට මහත් වූ අපහසුතාවකි. මංගල්ලය යනු මෙයද?

මංගල්‍යය අත ළඟ වෙන විට මීසමේ පියතුමාට, ගමේ තරුණ තරුණියන්ව මතක් වෙන්නට පටන් ගනී. පොල් එකතු කරන්නට, පොල් තොරණ ගහන්නට, පල්ලිය සරසන්නට, පල්ලිය වත්ත සුද්ද කරන්නට, වීදි යන මාවත සරසන්නට තරුණ, තරුණියන් නැතිවම බැරි බව එතුමා දනී. නොවාන සමය තුළ දී තරුණ තරුණියෝ (විශේෂයෙන්ම තරුණයෝ) දවස පුරාම පොල් එකතු කරන්නට මීසමේ ගෙයක් ගෙයක් ගානේ යති. සවස් වන විටත් කාර්යය තවමත් අවසන් නැත. නමුත් තරුණයන් විඩාවට පත් වී, අවසානය. ඉතිං! නොවානයට සහභාගි වන්නට හිතේ මෙන්ම ගතේද නිදහසක් නැත. ඒ ගැන අහන්නටවත් මීසමේ පියතුමාට අවශ්‍යතාවක් නැතිවා සේය. එතුමාට අවශ්‍ය පොල් ටිකය, පොල් තොරණය. තවත් තරුණයෝ නොවානය අවස්ථාවේදී පවා තොරණ සකස් කරති. පූජාව මැද්දී පූජාව නතර කොට ඒ අයට ඒ කාර්යය නතර කරන්නැයි කියන්නට දේශක පියතුමෙකු ලෙස මට සිදු වූ අවස්ථාවන් ඇත. බොහෝ තරුණ තරුණියන්ට නොවාන සමය තුළදී පූජාවට එන්නට, දේශනාවට ඇහුම්කම් දෙන්නට, පාප උච්චාරණය කරගන්නට අවස්ථාවක් නැත. ඔවුන් හැම දෙනාම මංගල්ලය ලස්සණ කරන්නට, සරු කරන්නට පුදුම උත්සාහයකය.

බොහෝ දේවස්ථානවල නොවාන සමයේදීම රතිඤ්ඤා සංදර්ශන ආරම්භ වෙයි. ඊයෙට වැඩිය අද රතිඤ්ඤා වැඩියි කියන්නට පෙලඹී ඇත. සන්ධ්‍යා මෙහෙයෙන් පසු දැල්වෙන රතිඤ්ඤා- වලට ලක්ෂ ගණන් වැයවේ. ඒත් අපට ගාණක් නැත. අපිත් උඩ බලාගෙන සතුටු වෙමු. ඒ මුදලින් නැති බැරි කෙනකුට ගෙයක් හදා දෙන්නට බැරිද? රෝහලක වාට්ටුවක් පිළිසකර කරන්නට බැරිද? දරුවන්ට පාසල් උපකරණ ලබා දෙන්නට බැරිද? ගමේ පොදු වැඩකට දායක වෙන්න බැරිද?

මංගල්‍ය දින වීදි සංචාරය කරන පෙරහැර ගැනද නොකියාම බැරිය. පල්ලිය කැප කර ඇති, සාන්තුවරයා හෝ වරියගේ ප්‍රතිමාව රැගෙන වීදි සංචාරය කිරීමේ අර්ථයක් ඇත. එහෙත් සීමාව ඉක්මවා ඒ වීදි මග දික් වෙන විට, එහි ඇති අර්ථය ගිලිහී යනු ඇත. එවැනි දීර්ඝ පෙරහැරවල් වල කිසිදු ආගමික භක්තියක් නැත. කතා කරමින්, කෑකෝ ගසමින්, විහිළු තහළු කරමින් බෙහෝ අය හැසිරෙන්නේ අහල පහළ වෙනත්

ආගම්වල අයටද වැරදි ආදර්ශයක් දෙමිනි. බොහෝ පිරිමින් පෙරහැරේ ගමන් කරන්නේ වෙරි මතිනි. පෙරහැරවලට සහභාගි වන්නේද අතලොස්සකි. මංගල්‍ය සමය තුළදී අවට දැකිය හැකි කඩ සාප්පු, සැණකෙළි, සංගීත සන්දර්ශන, මංගල්ලයේ සැබෑ තේරුම අපගෙන් ඈත් කරයි. මේ වන විට දේවස්ථාන භූමි වලින්, මේ කඩ සාප්පු සැණකෙළි ඉවත් කර ඇත. අපි ඒ ක්‍රියාව අගය කරමු. එහෙත් ඇතැම් දේවස්ථාන වල තවමත් මේ දේ ක්‍රියාත්මක වේ. මංගල්‍යයක් යනු සැණකෙළියක් නොවේ.

මීසමේ පියතුමාට මෙහිලා භාරදූර වගකීමක් ඇත.

"ඕවා නවත්තන්න බැහැ"

"ඕවා ගැන කථා කරන්න ගිහිල්ලා, මොකට වාද වෙන්නද". "උන් ඕනෑ දෙයක් කරගත්තුදෙන්"

"ඕවා සම්ප්‍රදායන්නේ"

ඉහත ලෙස ප්‍රකාශ කරමින්, අත සෝදාගෙන පිලාත්තු චරිතය රඟපෑම පූජක අපට යෝග්‍ය නොවේ. සැදැහැවත් ජනතාව හරි දැක්ම කරා ගෙන යෑම, "වැරදි දේ වැරදියි" යැයි, පවසා ඔවුනට යහපත් මග කියා දීම පූජක අප ලැබූ වගකීමකි.

මේ ලිපිය තරමක් ඍණවාදි එකක් වුවද, ඍණවාදි වීම මාගේ අරමුණ නොවේ. හරි දැක්මක් කරා ගෙන යෑම අඳුරින් ආලෝකයට සංක්‍රමණය කරන්නට උදවු වීම මාගේ පරමාර්ථයයි.

මංගල්‍ය සමය තුළ දී තිබිය යුතු සිරිය, අසිරිය ගැන විවාදයක් නොමැත. මම ද එයට පෞද්ගලිකව ආසා කරමි. එහෙත් එය සීමා අබිබවා ගොස් ප්‍රතිපදාවට වඩා ආමිසයට මුල් තැන දෙන විට එතැන විසඳිය යුතු පැනයක් ඇත.

**අති ගරු රොෂාන් සිල්වා නිමනි පියතුමා**
ප්‍රාදේශාධිපති - කොළඹ ප්‍රාදේශිකය,
ඕ මැසනඩ් නිවාසය, මට්ටක්කුලිය.

# කන්තාරු මාස්ටර් ...

කුඩා කඳු ගැටයක් මත පිහිටි පුංචි දේවස්ථානයේ වාර්ෂික මංගලෝත්සවයට සැවොම සූදානම් වෙයි. අවුරුදු පණහකටත් වඩා වැඩි කාලයක් පැරණි වුවත් කිසිදු නවීකරණයක් නොකරන ලද දෙව්මැඳුර ප්‍රදේශයේ දිළිඳු බව මොනවට කියාපායි. දෙව්මැඳුරට අයත් සීමිත පවුල් සංඛ්‍යාව ඉමහත් ආදරයෙන් භක්තියෙන් දෙව්මැඳුරේ වැඩ කටයුතු වලට නොපිරිහෙළා තම ශ්‍රමය කැප කරයි. මිල මුදලින් නොව සෑම දේම තම ශ්‍රමයෙන් කෙරෙද්දී ඒ දෙව්මැඳුර තමන්ගේම නිවස බඳු හැඟීමක් සෑම දෙනා තුළම ඇතිවෙයි.

මේ මංගල්‍ය සමයේ යම් තරමක පිබිදීමක් ප්‍රබෝධයක් තම මීසම තුළ ඇතිකිරීමට නවක පියතුමා බොහෝසේ උත්සාහ දරයි. ගම් වාසීන්ට හැකි අයුරින් මංගල්‍යය ජයට පැවැත්වීම මෙතුමාගේ අදහස වී ඇත. මිනිස්සුන්ගේ පසුම්බිවලට නොරිදෙන ලෙස මංගල්‍යය පැවැත්වීම මෙතුමාගේ අරමුණ වී ඇත. ඒ නිසා බොහෝ දෙනෙක් මෙතුමා සමඟ උරෙනුර ගැටී වැඩ කටයුතු කරති.

එක නිවසකින් එක කොඩියක් වත් අලුතෙන් කොඩි ගසට එකතු කරන්නැයි පියතුමා හැකි අයගෙන් ඉල්ලා සිටියේය. එය පිළිගත් සෑම දෙනම තමන්ට හැකි අයුරෙන් කොඩියක් දෙකක් සැපයීමට හිතාගෙන ඇත.

තරුණ පිරිස ටිකෙන් ටික තම ශ්‍රම දායකත්වයෙන් දේවස්ථානයේ අවට පරිසරය පිරිසිදු කිරීමට සූදානම් වෙති. දෙව්මැඳුර සෝදා පවිත්‍ර කිරීමත් ඔවුන්ගේ න්‍යාය පත්‍රයේ එක් කරුණකි.

දේවස්ථානයේ කන්තාරු මාස්ටර් එනම් ඇන්ටනි මාස්ටර් කල් වේලා ඇතුවම තම පියානෝ එකෝඩියනයට නව පෙනුමක් දුන්නේය. එය අතපත ගාමින්, නවමු තාල වයමින් මංගල්‍යයේ ගීතිකා ගායනයට සූදානම් විය.

"තව කල් තියෙනවා. මට සුමාන දෙකක් ඇති අපේ ගායනා කණ්ඩායම පුහුණු කරන්න" යැයි

18 වන පිටුවට ....

**ඇග්නස් චන්ද්‍රකාන්ති ජයමාන්න**
**මීගහවත්ත, සියඹලාපේ.**

# ලක් කිතු සසුනේ ආරම්භය පෘතුගීසින්ගෙන්ද?

ශ්‍රී ලංකීය කතෝලික සභාව විවිධ බාධා, අභියෝගාත්මක යුග පසුකරමින් දේව සංරක්ෂණය තුළ අද දක්වා පැමිණ ඇත. කොළඹ අගරදගුරු පදවිය හා රදගුරු පදවි 12 ක රදගුරුතුමන්ලාගේ සහ පූජක පැවිදි සැමගේ මඟපෙන්වීම යටතේ ලංකාව තුළ අපෝස්තලික දූත මෙහෙවර සිදුකරමින් සිටී. ජනගහනයෙන් 7.4% ක් පමණ වන කතෝලික හා ක්‍රිස්තියානි ප්‍රජාව අනික් ආගමික හා ජනවාර්ගික ජනතාව සමඟ සුහදශීලිව ජීවත් වෙති.

ලංකීය කිතුනු සභාවේ ආරම්භය දෙස බැලීමේදී ඒ පිළිබඳව ලිඛිත ඉතිහාසය, 16 වන සියවසේ පෘතුගීසින් මෙරටට පැමිණීමත් සමඟ ආරම්භ වුවද පුරාවිද්‍යාත්මක හා ඓතිහාසික තොරතුරු හා දත්ත මගින් ගම්‍යවනුයේ ලංකාවේ කිතුනු සභා ඉතිහාසය පෘතුගීසින් පැමිණීමට සියවස් ගණනාවකට පෙර අතීතයකට හිමිකම් කියනු බවයි. පෘතුගීසින් මෙරට මුහුදුබඩ ප්‍රදේශ අල්ලා ගැනීමත් සමග මෙරට තුළ කිතුදහම ශීඝ්‍රයෙන් ව්‍යාප්ත වුවද කිතුදහමේ මුල් බීජ මෙරට තුළ රෝපණය වූයේ ඊට බොහෝ කාලයකට පෙරය. පෘතුගීසින්ට පෙර මෙරට කිතුනුවන් සිටි බවට පවතින ප්‍රධානතම සාක්ෂිය වන්නේ ග්‍රීක ජාතික දේශ ගවේෂකයෙකු වූ කොස්මස් ඉන්ඩිකෙප්ලෙයුටස් නැමැත්තාගේ වාර්තාවයි. ඔහු විසින් රචිත "The Christian Topography" කෘතියේ එවක ලක්දිව පර්සියාවෙන් පැමිණි කිතුනු භක්තිකයන් පිරිසක් සිටි බවත් ඔවුනට සේවය කිරීමට පූජකවරයකු හා තේවාචාරවරයකු සිටි බවත් සඳහන් කරයි. ක්‍රි.ව 1912 දී E R අයර්ටන් නැමැත්තා විසින් ගලක කෙටු කුරුසියක් අනුරාධපුයෙන් සොයාගනු ලැබූ අතර ඒ සම්බන්ධයෙන් සිදුකළ විශ්ලේෂණයකදී ඒ කුරුසිය කොස්මස් ඉදිරිපත් කළ මෙරට සිටි පර්සියානු ජාතික කිතුනුවන් භාවිත කළ කුරුසියක් බව දක්වයි. එහෙත් මේ කුරුසිය සම්බන්ධයෙන් ඉදිරිපත් වී ඇති අතීත පිළිගැනීම වන්නේ මේ කුරුසිය ධර්මදූත සේවය සඳහා ඉන්දියාවට පැමිණි ශු. තෝමස් අපෝස්තුලුතුමන්ගේ ශ්‍රාවකයන්ට අයත් කුරුසියක් බවයි. අනුරාධපුරයෙන් හමුවූ මෙම කුරුසියේ සතර කෙළවර මලක හැඩයකට සකසා ඇති අතර එවැනිම හැඩයෙන් යුත් කුරුස දකුණු ඉන්දියානු දේවස්ථාන වලින් හමුවී ඇත. එසේම කොළඹ ජින්තුපිටිය ප්‍රදේශයේ කැණීම්වලින්ද එවැනිම හැඩයෙන් යුත් ගලක කෙටූ කුරුසියක් හමු වී අත.

ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යා කොමසාරිස්වරයකු වශයෙන් සේවය කළ මහාචාර්ය සෙනරත් පරණවිතාන මහතා විසින් රචිත "සීගිරිය" නැමති කෘතියේ මෙරට කිතුනුවන් සිටිබව දක්වයි. මෙයද පෘතුගීසින්ට පෙර මෙරට කිතුනුවන් විසූබවට සාක්ෂියකි. ඔහුගේ කෘතිය අනුව කාශ්‍යප (ක්‍රි.ව. 473 - 491) හා මුගලන් (ක්‍රි.ව. 491 - 508) යන් රජවරුන්ට සේවය කිරීමට 5 වන සියවසේදී පමණ ඉන්දියාවෙන් පැමිණි සෙබළුන් අතර කිතුනු භේවාහටයන් සිටිබවත්, මිගාර නම් කිතුනු සෙන්පතියාගේ නායකත්වයෙන් ඒ පිරිස පැමිණි බවත් දැක්වෙයි. ලංකාවට පැමිණි මිගාර සෙන්පතියා සිගිරියට නුදුරු ප්‍රදේශයේ "අභිෂේක ජෛන/ජින" වෙනුවෙන් දෙව්මැඳුරක් ඉදිකොට එය කැප කිරිමේ උත්සවයක් පැවැත්වූ බව චූල වංශයේ සඳහන්වේ. මහාචාර්ය සෙනරත් පරණවිතාන මහතාගේ මතය අනුව " අභිෂේක ජෛන/ජීන" ලෙස හඳුන්වා ඇත්තේ ක්‍රිස්තුස් වහන්සේය. මීට අමතරව මුගලන් රජ සමයේ භාවිත වූවායැයි සැලකෙන කිතුනු ලාංඡන සහිත රන්කාසි හමුවී ඇත.

මලබාර් ජනප්‍රවාදයේ එන කතා පුවතක් වන්නේ ශු. තෝමස් අපෝස්තුලු තුමන් මලබාරයේ සිට ලංකාවටත්, මලක්කාවටත් ගමන් කළ බවයි. එමෙන්ම ක්‍රි.ව. 52 දෝ පමණ ශු. තෝමස් අපෝස්තුලු තුමන් ඉන්දියාවට පැමිණ ධර්ම ප්‍රචාරය සිදු කළ බවට සාක්ෂි පවතී. අතීතයේ සිටම ඉන්දියාව හා ලංකාව අතර තිබූ සම්බන්ධතාව නිසාම ශු. තෝමස් අපෝස්තුලු තුමන්ගේ ශ්‍රාවකයන් මෙරටට පැමිණෙන්නට ඇතිබව විශ්වාස කරයි. මෙය පෘතුගීසින් මෙරටට පැමිණීමට පෙර මෙරට කිතුනුවන් සිටි බවට වැදගත් සාක්ෂියකි.

බෙන්ජෙමින් රබායි නැමත්තාගේ සටහන්වලට අනුව 12 වන සියවස වන විට ලංකාවේ ජුදෙව් ක්‍රිස්තියානින් 2300 ක් පමණ ජීවත් වී ඇති අතර ඔවුනට සේවය කිරීමට පූජකවරුන් හා දේවස්ථාන පැවති බව සඳහන් වේ. ක්‍රි.ව. 911 දී පමණ මෙරට රජ කළ බව අබුසයිද්ගේ සටහන් වලින් දැක්වේ.

මේ අනුව පෙනී යන්නේ පෘතුගීසින් පැමිණීමට පෙර මෙරට ක්‍රිස්තියානි ජනතාව ජීවත් වූ බවත් පෘතුගිසි පැමිණීමත් සමග කිතුනු ජනගහනය වර්ධනය වූ බවයි.

**බී. කේ. මාලින්ද එරෝෂාන් රුද්‍රිගු - පළමු වසර**
ශාස්ත්‍ර පීඨය - පේරාදෙණිය විශ්වවිද්‍යාලය.

කන්තාරු මාස්ටර් ... 16 වන පිටුවෙන්

සිතමින් ඔහු අලුත් ගීතිකාවල තාල අත්හදා බැලුවේය. ඔහුගේ නිවසින් නිතරම සංගීත ස්වර තාල නැංවී අවට පරිසරයම ගීතවත් වූයේ ය.

"අනේ මංදා ඔයාට දැන් සංගීතය මිසක් වෙන කිසි දෙයක් ඕනෙ නැහැ වගේ." "ඔව් ඔව් සංගීතය මාගේ ආහාරය වේ කියල කියනවනෙ නෝනේ." "අනේ හොඳයි එහෙනම් ඔයාට අපි උයන කෑම ඕනෙ නැහැනෙ නේද? අපිට ලාභයි." "පිලමිනා මම මේ මගේ එකෝඩියන් එක ටියුන් කරනව. අපේ පල්ලියේ මංගල්‍යයට හොඳ ගීතිකා ටිකක් ගහන්න ඕනෙනෙ. අලුත් ගීතිකා කීපයක් සූදානම් කරගන්න ඕනෙනෙ." ඉතිං ඔයා විතරක් පුරුදු වෙලා හරියනවයැ. පල්ලියෙ ළමයින්ටත් පුරුදු කරවන්නකො." "අපේ ගීතිකා කණ්ඩායමේ දරුවන්ගෙ කටහඬ මම හොඳට පුහුණු කරවල තියෙන්නෙ. හොඳට තාලය උස් පහත් කරල ගයන්න දක්ෂ දරුවො ටිකක් මට ඉන්නෙ. හරිම දක්ෂ දරුවො. මට සුමාන දෙකක් ඇති එයාලව පුහුණු කරවන්න." "ඔයා ඉතිං ගමටම ඉන්න දක්ෂම සංගීත මාස්ටර්නෙ. ඔයාගෙ සංගීතෙට ගහන්න කවුරුත් අහල ගංහතකවත් නැතුව ඇති." "මම ගීතිකා ටිකක් තෝරල අපේ සුවාමි එක්ක කථා කරගන්නත් ඕනෙ. එතුමගෙ අනුමැතිය ඕනෙනෙ." "ඒක හොඳයි ඔයාගෙ දුවට වත් පුතාල දෙන්නටවත් සංගීතය පිහිටල නැහැනෙ. ඔයා වගේ තමයි සංගීතය ඇගේ නැහැනෙ." අනේ අනේ මම ඉතිං කියන්නෙ නැහැ." "හරි හරි මම විහිළුවක් කළේ මගේ හාමිනේගෙ කටහඬට ගහන්න කටහඬක් ඒ කාලෙ මේ ගම් තුලාවෙම තිබුණෙ නැහනෙ. ඒකනෙ මමත් වශී වුණේ." "ඔව් ඔව් නරක් වෙලා තියෙයි" කියාගෙන හිනැහෙමින් ඈ ගියාය.

මෙසේ ටිකෙන් ටික කාලය ගෙවී ගියේය. දිනක් ඇන්ටනි මාස්ටර් සංගීත ස්වරයක් වයමින් සිටියදී නිවසට පැමිණි පොඩි පුතා, "තාත්තා තනියම සංගීතෙ පුරුදු වෙනවද? අන්න පල්ලියෙ සංගීතෙ පුරුදු වෙනව. කන්තාරු කණ්ඩායමයි සුවාමියි පල්ලියෙ ගායනා පුහුණු වෙනව." "මොනව මේ මම නොදැන!" "ඔව් ඔව් තාත්තා ගිහිං බලන්නකො."

මේ ආරංචිය ඇසුණු විගසම මාස්ටර් කලබල විය. ඇඳ සිටි සරමට උඩින් කමිසයක් දමාගෙන ලහි ලහියේ පල්ලිය දෙසට ගියේය. පල්ලියට ළං වෙත්ම සංගීත රාවයක් ඔහුගේ දෙසවනට ඇසිණ. ගායනයත් ඊට ඉහළින් සුමිහිරි වාදනයකුත් ඔහුට ඇසිණ. ඔහුගේ පය තව තවත් ඉක්මන් විය. දේවස්ථානයට ගොඩවෙද්දී හොඳින්ම සංගීත රාවය ශ්‍රවණය විය. කාටත් නොදැනීම ඔහු දේවස්ථානයේ පැති මැදුරට එබිකම් කළේය. එක් අයෙක් ගායනා කණ්ඩායමේ ළමයි වට කරගෙන ඕගනයක් වයන අයුරු ඔහු දුටුවේය. පියතුමාද පිටුපසින් හිඳගෙන සිටිනු දුටුවේය. මාස්ටර්ගේ අත් මිට මෙළවිණ. දෑසින් ගිනි පිටවීය. විශාල බරක් පපුව තුළට ඇතුළු විය. එහෙත් නිහඬවම මිදුලට බැස්සේය. හෙමිහිට ප්‍රධාන දෙව්මැඳුරට ඇතුළු වූයේය. හදවතේ පිරුණු වේදනාව හෙමිහිට දෑස දිගේ ගලා එද්දී අන්තෝනි මුනිඳුගේ ප්‍රතිමාව දෙස බලා සිටියේය. දෑසේ නැගුණ කඳුළුවලින් සුරුවම බොඳවී පෙනුණෝය. හිස නමාගෙන කඳුළු පිස දමා ටික වේලාවක් සිටියේය. හදවත පුරවාගෙන සිටි දුක දිග සුසුමකින් පිටකර, නැගිට සිටියේය. දිව්‍ය සත්ප්‍රසාදයේ ජේසු වෙතටද ගොස් බිමටම නැමී වන්දනාමාන කළේය. දුකින් පිරුණ දෙනෙත් දල්වා දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ දෙස බලාගෙන සිටියේය. කිසිවක් කථා නොකර හිස් බැල්මෙන් බලා සිටියේය. මද වෙලාවක් නිසොල්මනේ සිටියේය. ඉන්පසු නැවතත් දිග සුසුමකින් ළය සැහැල්ලු කර ගත්තේය. හෙමිහිට නැගිට දෙව්මැඳුරෙන් එළියට පැමිණ නිවස වෙත යාමට මගට බැස්සේය.

බලාපොරොත්තු සුන් වූවකු ලෙස හිස නවාගෙන නිවස බලා පිය නැගුවේය. ඔහු තම කාමරයටම ගියේය. පියානෝ එකෝඩියනය උකුළට ගත්තේය. එය අත ගාමින් ටික වේලාවක් ගතකළේය. ඉන්පසු පාදුවා නගරයේ ශුද්ධවර ඔබා - පුදමු මේ ගී ගයා මුදුනෙ මල් තබා යන ගීතිකාව වයන්නට විය. පුතාගෙන් ආරංචිය ලත් පිලමිනා කිසිදු වදනක් නොදෙඩීය. වාදනය නැවතුණ පසුව ඇය හෙමිහිට කාමරයට ගියාය. "සුවාමි කාව හරි ගෙනල්ල. ඕගන් එකකුත් ගෙනල්ල ගීතිකා පුහුණු කරනව" යැයි මාස්ටර් හෙමිහිට කීවේය. ඇයද වදනකුදු නොදොඩා බලා සිටියාය. ඇයගේ සිතද බොහෝ සෙයින් වේදනාබර වී ඇත.

"අපි දැන් වයසයිනෙ පිලමිනා අලුත් දේවල් අපි දන්නෙ නැහනෙ. ඕවා ඔහොම තමයි." "ඔව් අනේ ඕවා ගණන් ගන්න එපා." "නෑ නෑ මට ප්‍රශ්නයක් නැහැ. ඒත් කිසි කෙනෙක් මට කිව්වෙ නැහැනෙ. අපරාදෙ මම වියදම් කරල මේක

රෙපෙයාර් කළේ.” “ඉතිං හොඳයිනෙ. ඔයා ගෙදර ඕක වාදනය කරන්න. මම ගීතිකා කියන්නම්. මට තාම පුළුවන් සිංදු කියන්න.” “ඔව් ඔව් ළමයි අහගෙ නවත් ඉන්නෙ නැනෙ.” “අපි ඉතිං ටික ටික වයසට යනවනෙ. ඔයා ඔය ගැන හිතන්න එපා. තරුණ ළමයින්ට තැනක් දෙන්නත් ඕනෙනෙ.” “ඔව් ඔව් ඒක ඇත්ත.” “දැන් බලන්නකො ඔයාගෙ ළමයි සංගීතෙට කැමති නැහැනෙ. ලොකු පුතා විතරයි ටිකක් හරි කැමැත්තෙන් හිටියෙ. ඒත් එයා දැන් බැඳල ඈතකට ගිහිංනෙ. ඉතිං ඔයාගෙන් පස්සෙ කවුද ඕක වාදනය කරන්නෙ? ඕක ගීතිකා කණ්ඩායමට බාර දෙන්න. ඊට පස්සෙ කාව හරි පුහුණු කරන්න.” “එහෙම කොහොමද? ඔයා කියන්නෙ මේක වෙන කාට හරි දෙන්න කියලද? මේක මගේ. මම මේකට හරි ආදරෙයි.” “ඔයාගෙ තමයි. ඒත් ඔයාගෙන් පස්සෙ මොකද වෙන්නෙ? ගෙයි මුල්ලෙ මකුළු දැල් බැඳි බැඳී තියෙයි. නැතිනම් ළමයි ඔය කාට හරි විකුණල දමයි.” එය ඇසුණ මාස්ටර් කල්පනාවට වැටුණි. ඒ දුටු බිරිඳ නැවතත් මෙසේ කීවාය. “ඔයා ඕක පල්ලියට දෙන්න. දීලා, එක්කෙනුකුට දෙන්නෙකුට පුහුණු කරන්න. එතකොට ඕකත් පරෙස්සම් වෙනව. දිගටම පල්ලියෙ වාදනයත් වෙනව.” “බලමුකො” කියමින් ඔහු මිදුලට බැස සක්මන් කරන්නට විය. මිදුලේ එහාටත් මෙහාටත් ඇවිදිමින් ටික වේලාවක් ගත කල ඔහු නිවස තුළට පැමිණියේය. මම මොකටද කනගාටු වෙන්නෙ ? පිලිමිනා කිව්ව වගේ අපේ කාලෙ ඉවරයි. නවීන උපකරණ, ක්‍රම එනවනෙ යැයි සිතින් සිතීය. ඒ සමඟම ඔහුගේ සිතට නැඟුනේ ඉමහත් කනස්සලු හැඟීමකි. සිතට කිසිදු සතුටක් නොදැනින. මහා බරකින් සිත පිරී ඇති බවක් ඔහුට හැඟිණ. හපල යුෂ උරා බීලා අහක දමන උක් දන්ඩක් වගේ අපට සලකන එක තමයි මගේ හිතට අමාරු. එත් ඉතිං මොනව කරන්නද අපි කරන්න පුළුවන්දේ උපරිමයෙන් කළානෙ.

මෙවැනි අදහස් අතර හිත දෝලනය වෙද්දී දවස් ගතවිය. මේ දින වල ගෙදරින් පිටත කිසිම තැනක ඔහු නොගියේය. නිවසටම වී කල්පනා කරමින් සිටියේය. ඒ දුටු දරුවෝ සහ බිරිඳ බියට පත්වී ඔහුට නොදැනෙන ලෙස නොයෙක් වැඩවලට ඔහුව හවුල් කරගත්තෝය. ළමයි සහ බිරිඳ ඔහු ලවා ගීත වාදනය කරවීය. බිරිඳ ගී ගැයුවාය. ළමයි ද තාල වරද්දමින් ගැයුවේය. “අනේ අනේ සංගීත මාස්ටර්ගෙ දරුවන්ට හරියට සිංදුවක් කියා ගන්න බැහැනෙ” කියමින් සැවොම සිනහ වූහ.

දිනක් ඔවුන් සියලු දෙනාම රූපවාහිනිය නරඹමින් සිටිනවිට “ගෙදර කවුද? මාස්ටර් දොර අරින්නකෝ” යනුවෙන් කවුරුන් හෝ කථා කළේය. “අපි අපි මාස්ටර් අංකල් අපි මේ ප්‍රසාදුයි දමිතුයි අපේ සුවාමිත් ඉන්නවා.” එය ඇසෙත්ම සියලු දෙනාම කලබල වූහ. මාස්ටර් කඩිනමින් දොර ඇරියේය. “ජේසු පිහිටයි! ෆාදර් එන්න එන්න ඇතුළට එන්න. වාඩිවෙන්න ෆාදර්. ඔය දරුවොත් එන්න වාඩි වෙන්න. ඇයි ෆාදර් මේ හදිසියේම?” මේ දවස්වල මාස්ටර් පෙනෙන්න නැති නිසා අපි ආවෙ බලන්න. අසනීපයක්ද මොකද කියල බලන්න. නිතරම පල්ලියට එන කෙනෙක් දකින්න නැතිවුණාම අපි හොයල බලන්න එපායැ.” “නැහැ ෆාදර් එහෙම අසනීපයක් නැහැ. මම මේ ... මේ ... මම ... මේ මේ ...” මාස්ටර්ට ගොත ගැසිණ. “ඒක නෙවෙයි මාස්ටර් අපේ පල්ලියෙ මංගල්‍යයට ගීතිකා පුහුණු වෙන්නත් ඕනෙනෙ.” “ඇයි ෆාදර් කවුද මහත්මයෙක් එක්ක මේ දරුවො පුහුණු වෙනව මම දැක්කනෙ. ඉතිං මම හිතුව මේ අපේ භාණ්ඩ දැන් පරණයිනෙ. අලුත් දේවල් අද තියෙනවනෙ.” “ආ! ඒක මේ මගෙ හිතවත් පියතුමෙකුගෙ පල්ලියෙ ඕගන් එක. එහෙ මහත්මයෙක් තමා ඒක වාදනය කරන්නෙ. පල්ලියෙ මංගල්‍යයෙන් පස්සෙ ඒක ආපහු දෙන්න ඕනෙ.” අනේ ෆාදර් මට සමාවෙන්න. මගේ හිතට පොඩි වේදනාවක් දැනුණා තමයි. ඒත් ඉතිං අපි වයසට යනකොට අලුත් පරම්පරාවට මේවා බාර දෙන්න ඕනෙනෙ.” “බොහොම හරි මාස්ටර්, බොහොම හරි ඒත් ඉතිං මාස්ටර්ලගෙ දැනුම අත්දැකීම් ළමයින්ට බෙදල දෙන්නත් ඕනෙ. ඒව හරි වටිනව. පරණ අදහස් කියල අහක දමන්න හොඳ නැහැ. ඒ පරණ දනුම තමයි මේ දරුවන්ගෙ අඩිතාලම වෙන්න ඕනෙ.” “ඔව් ෆාදර් මම එන්නම්, මගේ මේ පියානෝ එකෝඩියන් එක මම පල්ලියට දෙන්න හිතුව. එතකොට මේ දරුවන් ගෙන් කාට හරි ඒක පුරුදු වෙන්න පුළුවනිනෙ. මමම පුරුදු කරන්නම්කො. මගෙන් පස්සෙ ඒක් දිගටම පල්ලියෙ තියෙයි නෙ. මේ මගේ දරුවො කවුරුත් සංගීතයට ලැදියාවක් නැහැනෙ” කියමින් දරුවන් දෙස බැලීය. “ඔව් ඔව් ඒක හොඳ වටිනා අදහසක් මාස්ටර් ඔයා ලොකු පරිත්‍යාගයක් කරන්නෙ. බොහෝම හොඳයි මම මේ පල්ලියෙ අද හිටිය, හෙට වෙන පල්ලියකට මාරු කළොත් එහෙට යනව. ඒත් ඔයාලා, මේ දරුවො හැමෝම මේ ගමේ මේ දේවස්ථානයෙ ඉන්න

21 වන පිටුවට ....

# නුඹලාගේ මංගල්ල මට එපා වෙලා - ආමොස් 5:21







මංගල මඟුල් විය යුතු වුවත් සඤ්ඤකය කිසිදා ශබ්ද නොවේ. මංගල හා මඟුල් කටවහර වියත් වහර පුරාය. මඟුල් ගෙදර මඟුල් කපුවා, මඟුල් පෝරුව, මඟුල් පූජාව විවාහය සබඳවය, මඟුල් මඩුව, මඟුල් බෙර, මඟුල් පොකුණ, මඟුල් ඇතා, රජමාලිගාව ඇසුරිනි. මඟුල් සක්වළ ප්‍රීතියෙන් ඉතුරුණු මෙලොවයි මඟුලෙ රඟ දැනෙන්නේ දරුවන් ලත් කලේයා යයි ජන කවියක එක් පෙළකි.

මංගල සූත්‍රයේ මංගල කාරණ 38 කි. දැනඋගත්කම ඉන් එකකි. දළදා මාලිගාවේ නානුමුර මංගල්‍යය හැම බදාදා ය. අනිත් වාර්ෂික මංගල්ල නම් අලුත් සහල් මංගල්ලය, අවුරුදු මංගල්ලය, පෙරහැර සහිත කාර්තික මංගල්ලය හා උපසම්පදා මංගල්ලයයි. ප්‍රධානතම දළදා පෙරහැර රැගත් ඇසළ මහෝත්සවයට මංගල්‍ය යෙදුම නොපෙනේ. මුඛ්‍ය, මූල්‍ය, ග්‍රාම්‍ය මෙන් මංගල්‍ය සැදී ඇත. මංගල්ලය ජනවහරේය.

ලෙවී ව්‍යවස්ථාවේ හා ගණන් කථාවේ මංගල්‍ය විස්තර වේ. දින හත අටක් පුරා පුරාණ ගිව්සුමේ මංගල්‍ය විය. පාස්කුව සහ නුමුහුන් රොටි මංගල්‍යය, නාඹුල් පල මංගල්‍ය, පෙන්තකොස්ත (50) හෙවත් අස්වැන්න මංගල්‍යය, අලුත් අවුරුදු මංගල්‍යය, වන්දි ගෙවීමේ මංගල්‍යය හා කූඩාරම් මංගල්‍යය ලෙස මංගල්‍ය 6 කි. නවවන දින සවස සිට පසුදින සවස දක්වා ලෙස වන්දිගෙවීමේ දිනයට පමණක් අදාළවේ.

ඉස්සර ජපමාලය, ප්‍රාර්ථනාව, දේශනාව, සත්ප්‍රසාද ආශිර්වාදය නුවානයට අඩංගු විය. නැතිනම් නුවාන කාලය පුරා ඥාන කාන්තිය විය. පාපෝච්චාරණය පිණිස පෝලිම් ගැසී සිටීමට පවා සිදුවිය. අද දිව්‍ය පූජාව සමග නුවානයකි. බොහෝදෙනාගේ අවධානය දේශනාවට හා දේශනාවාදියාට ය. පියතුමන් දෙදෙනකු අතර තරඟ නැතිනම් තර්ක දේශනාව දැන් දකින්නට නැත.

වර්තමාන මංගල්‍ය ලෙවී 23:32 අනුව සිදුවනු පෙනේ. නවවනදින (වැස් පර දිනය) පසුදින (මංගල්ල දින) සවස දක්වාය. මංගල්‍යය දා මංගල මහ පූජාවට අතිරේකව සවසත් තව පූජාය. සමහර මංගල්‍ය සාන්තුවරයාගේ මංගල්‍යයේ නියම දිනයට පවත්වන බැවින් ඉරිදා සාමාන්‍ය නුවාන දිනයකි. හැම දේවස්ථානයක වාර්ෂිකව දිව්‍ය සත්ප්‍රසාද මංගල්‍යය සිදු කෙරේ. නොවැම්බර් 2 මළවුන්ගේ මංගල්‍යය ලෙස හැඳින්වීම විශේෂත්වයකි. සමහර දේවස්ථානවල මංගල්‍ය දෙකකි. උදාහරණ පමුණුගම, නායකකන්ද, ගල්වැටිය.

නොවාන කාරයන් තරඟයට නුවාන පැවැත්වීම හරි නැත. කොඩිගස ඔසවන දා කිරිබත් දානයකි. රබන්ද ගැසේ. කොඩිගසට නා නා කොඩි බාර ලෙසටය. මංගල්ලයට පෙර ප්‍රධාන කාර්යය වෙළෙඳුන්ට කඩ වෙන් කර දීමයි. නොවානයට පසු ගිනි කෙළි සන්දර්ශන පැවැත්වේ. මංගල්‍යයට පෙරත් පසුත් සැණකෙළිය.

ලූක් 2:41 ජේසුස්වහන්සේගේ මව්පියෝ අවුරුදු පතා පාස්කු උළෙල සඳහා ජෙරුසලමෙට ගියහ. ලූක් 22:7 පාස්කු බැටළුවා පූජා කළ යුතු නුමුහුන් රොටි මංගල්‍ය දවස පැමිණියේය. ක්‍රියා 2:5 මිහිපිට හැම රටකින් පැමිණි බැතිමත් ජුදෙව්වරු ජෙරුසලමෙ සිටියෝය. මේ පෙන්තකොස්තයට පැමිණි අයයි. පාස්කු භෝජනයට අප කොතැන පිළියෙළ කරන්ට ඔබ කැමතිද? මතෙව් 26:17 පාස්කු බැටලු පැටවා පූජාවන නුමුහුන් රොටි මංගල්‍යය මාක් 14:12 නියමිත මොහොත පැමිණ තිබෙන බව පාස්කු මංගල්‍යයට පෙර උන්වහන්සේ දැනගත් සේක. ජොහාන් 13:1 පාස්කු මංගල්‍යයට සූදානම් වන දවසේ මද්දහන වේලාව පමණ විය. ජොහන් 19:14 ඒ සබත් දින විශේෂ දිනයක් බව ජුදෙව්වරු දැන ජොහන් 19:31 ජුදෙව්වන්ට මේ සබත විශේෂ වුවත් බැටළු පෝතකයාගේ මහ පාස්කු බිලි පූජාව නිසා සකල ලෝකයට මේ දවස අති උත්කෘෂ්ට විය.

නත්තල හා නත්තල් සීයා වාණිජීකරණය ගැන කතා වුවත් පල්ලියෙ මංගල්ලෙ එසේවීම ගැන කවුරුත් කතා නොකරති. දේවමාලිගාවේ වාණිජ්‍යයට එරෙහිව නැගී සිටිසේක් ස්වාමින්වහන්සේමය. සුවිශේෂ හතරම මේ පුවත වාර්තා කරයි. ජුදෙව්වරුන්ගේ පාස්කු මංගල්‍යය ආසන්න වූ බැවින් ජේසුස්වාමිදරුවෝ ජෙරුසලමෙට වැඩිය සේක. එවිට දේව මාලිගාවේ ගව, බැටළු, පරෙවි වෙළෙඳුන්ද මුදල් මාරුකරන්නන්ද ගනුදෙනු කරනු දැක උන්වහන්සේ කසයක් සාදා ගවයන්, බැටළුවන් සමග සියල්ලන් පිටතට එළවා මුදල් මාරුකරන්නන්ගේ කාසි විසුරුවා මාගේ පියාණන්ගේ ගෘහය වෙළඳපලක් නොකරන්නැයි වදාළ සේක (ජොහන් 2:13-16).

දෙවියන්වහන්සේ නියම කළ මංගල්‍ය මිනිස්සු ඒවා තමන්ට කරගෙන අවභාවිත කර ඝෝෂාකාරී ගායනවාදන වලින් ඒවා දූෂ්‍ය කළහ.

නුඹලාගේ මංගල්‍ය මට අප්‍රියයි. තිත්තය. මට රුස්සන්නේ නැත. මට පූජා කරන තර කළ සතුන් මම නොපිළිගනිමි. ගීත ඝෝෂා නවත්වන්න. වීණා වාදනයට මම සවන් නොදෙමි (ආමොස් 5:21-23).

**පිලීෂන් අබයකෝන්**

කන්තාරු මාස්ටර් ... 19 වන පිටුවෙන්

ඕනනෙ". "ඔව් ෆාදර් ඒක තමා ඇත්ත. මේ අදහස අපේ නෝනා, මේ පිලමිනා තමයි යෝජනා කළේ. මම ඉතිං වැනි වැනී හිටිය. දැන් මගේ හිතට හරි සතුටුයි." ඉන්පසු සතුටු සාමීචියේ යෙදී තේ පැන් සංග්‍රහයක් ද භුක්ති විඳ, පියතුමා ඇතුළු පිරිස ආපසු ගියෝය.

"මගේ හිතට හරි සතුටක් දැනෙනව පිලමිනා. හරි නිදහසක් දැනෙනව. ඔයා තමා මේ අදහස මට දුන්නෙ. ඒ නිසා මේ සන්තෝසෙ අයිතිකාරි ඔයා තමා" කියමින් ඇන්ටනි මාස්ටර් සිය බිරිඳගේ කර වටා අත දමා ළං කර ගත්තේය.

# ඕං එහෙනං



කලකට පස්සේ වෙලකට බැස්සේ කුස්සිය මුල්ලට රිංගන්නයි
කුස්සිය පැත්තේ හරිම කලබලේ මංගල්ලේ ළඟ එනවාමයි
දූවරු එනවලු පුතාලා එනවලු යාළුවෝ නෑයොත් එනවාමයි
බජට් හදනකොට ඉහ මොළ රත්වී වැට් එකසිහසුන් වෙනවාමයි

කුස්සිය පැත්තෙ එසේමමයි පල්ලිය පැත්තෙ කොහොමයි වෙන්නේ
දහම් සභාවත් වැඩ කිඩ පෙන්වන මංගල සභාව රැස් වෙන්නේ
කොඩිගස ඔසවා පෙරහැර කෙරෙනා දානේ උයන හැටි කතිකා වෙන්නේ
අලුත් ස්වාමිගේ අළුත් අළුත් වැඩ කචල් කචල් මැද නතර වෙන්නේ

පල්ලියෙ සැරසිලි දිව්හද සමිතිය වීදි පාර පාර අයිනේ ජනයයි
දරුවෝ සමාගම් තොරණ ගහන්නට තේමා සොයමින් ළතවෙයි
පාටින් පාටට විදුලි බුබුළු හැඩ සැරසිලි තරුණ සමිතිය වෙත දුන්නෙයි
පල්ලිය වත්තම සුරපුරයක් වගෙ නායකයෝ හරි සතුටු වුණෙයි

කඩ වීදියේ කඩ කුලියට දෙන්නෙ කොඩි ගසේ කොඩිටික අලෙවි වුණේ
කිරිබත් කන්නට පොරකන සැදැහවත් ජන කිරිපැණි නාගෙන තානනනේ
පල්ලියෙ දොරගුලු තදකර දැමුවේ ටයිල්ටික පල්ලියෙ බේරන්නයි
වැස්සකටවත් පල්ලි නොයන උන් කොඩිගස වටේට දණ ගැසුවෙයි

මංගල එළියයි මාවත් සුදුවෙයි ඩෙංගු මර්දනය කරලා වාගේ
පාරේ කුණු ගොඩ බෙදා ගන්නබෑ පොලු කැති මන්න පිහිට පැතෙයි
දහම් සභාවත් හනිකට ඇවිදින් රංඩුව සමතෙට පත් කෙරුවයි
තව පොඩ්ඩෙන් මංගල්‍ය නිමාව අවමංගල්‍යයෙන් අහවරවෙයි

දිගටම නුවාන සුපිරි දේශන පශ්චත්තාපය දෝරෙ ගලයි
නත්තල් මංගල්ලෙන් පණ බේරා ගත් උඟරන්, කුකුළන් කඳුළු සලයි
විලාසිත මන්දිරයක් වාගෙයි පල්ලිය නෙකතෙන සුවඳින් සුවඳ කෙරේ
සොහොනට සුදු හුණු ගෑවා වාගෙයි දෙවිඳුගෙ ජනයා මඟුල් කතෙයි

**සූරිය මාමා**



# OUR CHURCH FEAST ......



It was such a stressful long waiting for some limited petrol quota during the crisis time. Everyone lined up there was highly impatient until their turn, which for most might certainly have been like the gate opening moment for Heavenly kingdom.

It was unexpectedly then, that I distantly heard the loud crackers and witnessed illuminating lights, as a crowd of people was slowly approaching amidst the performance of a few musical bands from the other way around. I was seriously wondering what it was all about, before I soon realized that was a church feast procession.

The immediate disturbing thought that touched my heart most was, can they be feasting while some others around are desperately fasting. Perhaps, could they have taken a different route avoiding this fuel queue, as desperate fuel liners could otherwise justifiably make strong allegations against the ones in procession and its organizers in particular, as really insensitive and indifferent to context. Then again, I was thinking to myself, such route change, might have created even a worse crisis with unending disputes among some typical parish groups.

Persevering to reconcile with such restless thoughts, I was still waiting for my most expected fuel turn, when I observed the feast procession, solemnly in progress. Years back church feast associated memories from my childhood, came to mind in flashes.

Of all, what I could dearly recall most is our dealings with the altar serving association, that knitted us really close so as to be in and around the church irrespective of the time of the day. Our village feast was unmistakably one, which closely united our parishioners to work harmoniously despite some internal disagreements, which could occur from time to time on human grounds.

I gazed my eyes at the church procession again, which was then closer to our fuel line than before, when I observed some faithful devotees garlanding the patron saint's statue with gold chains. Many others were really busy trying their best to reach out to the same, amidst certain disapproval of some officials in badges, who however apparently displayed a kind of a soft corner allowance towards some, whom I believe could obviously have been their kith and kin. A quote from the Bible just then struck my mind, which reads as "You should not bow down to them or worship them (an Idol) for I the Lord your God"(Exodus 20;5)

I was still lingering on my memory lane, refreshing how our external preparation was for the church feast back then. Rather than taking a spiritual step forward in making God more tangible, newer outfits, impressive looks, and routine celebrations seemed to have mattered to most of us parishioners since then.

Initially as altar servers and later as the Youth association members, what we were more focussed was somehow to put up an elegant pandol and organize fund raising games etc. even during the novena times, except when some inspiring priests displayed a strong

opposition against such practices.

I began to strangely realize how long years have swiftly passed by since then, although such age-old superficial practices have remained quite unchanged, come what may. Has not time thus long passed for many us to whole heartedly experience the almighty presence of God and to be more profoundly led by the Holy Spirit, promised by Jesus as our comforter?

Should not it realistically be the internal transformation of our lives that we should strive harder towards, than being mere ritual followers as Jesus himself advised on what should bother us most when he advised Martha, "**You are worried and distracted by many things, there is need of only one thing**" Luke 10 :41.

Hence may being at Jesus' feet, listening to His Word and transforming our lives accordingly, not remain a far cry! May we all gracefully embrace Jesus as the Risen Lord as we urgently should concentrate on the essence more often than not.

This would truly become a reality only if we are constantly led by the Holy spirit, who as an assuring person would inspiringly lead our decisions for us to mature into our holistically unique image, which God had destined for each of us, long before we were even conceived in mother's womb.

Would not such life style be a definite confirmation on winning the heavenly kingdom, the glorious attainment of which, is undeniably the ultimate aspiration of our short – lived human lives on earth?

**Gihan Fernando**
**Director, Institute of British Examinations ( pvt) Ltd**

## කාව සිත

### හීන .....

හීන දැකලා ඇස් ඇරන්
හීන වෙනුවෙන් මැරෙනා උන්
කම්කරුවො අත් වැල් බැඳන්
අසාධාරණේ වළ දාලා දැන්

පඩිය සොම්නස ඉතිරිලා
වෙහෙස ගොස් දැන් පා වෙලා
අඳුරු තැන් එළියක් වෙලා
කම්කරුවො හිමිකරු වෙලා

දිනය කම්කරු වැඩක් නෑ
"සටන්" කියලා දෙයක් නෑ
දෙව්ඳු පැතුලොව සැබෑවී ඇත
ජුසේ හිමිහිට "ෆිට්" කියා ඇත

**චමත් බී පයාගල**
කටුකුරුන්ද - කළුතර

## අමිතගේ හද ගැස්ම......



# පල්ලියේ මංගල්‍යයයි - කිතුනු අපේ අධ්‍යාත්මයයි

"මංගල සිරි මවලා - ඔබෙ ගුණ පසසාලා
ඔබ දෙපයේ වැටිලා - මවෙ ඔබෙ සරණෙ එමූ"

ඉහත ගීතිකා ඛණ්ඩය කිතුනු අපගේ දෙසවනට නුපුරුදු දෙයක් නම් නොවේ. මංගල්‍යය පිළිබඳ සාකච්ඡාවේදී, එහි මූලික හරය ඉතා අපූරුවට එයින් ගෙන හැර දක්වයි. නමුත්, කිතුනු අප සමරන මංගල දින මෙලෙස දැයි අප කවුරුත් පෞද්ගලිකව සිතා බැලිය යුතුය. කිතුනු අපට අපගේ ගමේ දේවස්ථානයක් තුළින් අපගේ ආධ්‍යාත්මික ජීවිතය වර්ධනය කර ගැනීමට දිව්‍ය පූජාව පෙරටු කොට ගත් විවිධ වැඩසටහන් ගරු පියවරු සංවිධානය කර දෙති. ඒ අතර එක් ප්‍රධාන සන්ධිස්ථානයක් වන්නේ, වාර්ෂිකව පැමිණෙන දේවස්ථානයේ මංගල්‍යයයි. අද අප සමරන දේවස්ථානයේ මංගල්‍යය සඳහා ඈත අතීතයට විහිද ගිය ඉතිහාසයක් ඇත. අතීතයේ දී දේවස්ථානවල නිතර සේවය කිරීමට ගරු පියතුමන්ලාගේ යම් හිඟයක් පැවතිණි. එනිසා ගරු පියතුමන් එක් කාල සීමාවක් එක් දේවස්ථානයක ජනතාවට අවශ්‍ය ආධ්‍යාත්මික සූදානම ලබා දී, දුර බැහැර පිහිටි අනික් දේවස්ථානයට ගමන් කරන්නේ, ආධ්‍යාත්මිකව අතරමං වූ බැටළු රැළ පෝෂණය කිරීමටයි. එවිට ගරු පියතුමන්ගේ පැමිණීම ගැමියන්ට දැන්වීමට පියතුමන් විසින් අහසේ ලෙලදීමට කොඩි ගසක් සිටුවයි. එය නෙත ගැටෙන ගමේ ජනතාව තම ආධ්‍යාත්මික ජීවිතය පෝෂණය කර ගැනීමට ගරු පියතුමන් කරා පැමිණියේ ඉතා උද්යෝගයෙනි. මේ කාරණය අතීතයේ සිට විකාශනය වෙමින් වර්තමානයේ අප සමරන මංගල්‍ය දක්වා විවිධ වූ වෙනස් කම් සහිතව ගලා ගෙන පැමිණ ඇත. අද අප සොයා බැලිය යුත්තේ, අපගේ මංගල්‍ය තුළින් ආධ්‍යාත්මික ජීවිතයට පෝෂණයක් ලැබෙනවාද යන්නය. කිතුනු අප මේ පිළිබඳ ව මොහොතක් තනි තනිවම සිතා බැලිය යුතුව ඇත.

කිතුනු අප බොහෝ දෙනා අපගේ දේවස්ථානවල සාන්තුවරයාගේ හෝ සාන්තුවරියගේ ජීවිතයේ මෙලොව අවසාන දිනය මංගල්‍යය ලෙස සමරති. මෙලෙස ඒ සාන්තුවර ජීවිත වල අවසාන දිනය අප මංගල්‍යය ලෙස සමරනුයේ, ඔහු හෝ ඇය මෙලොව ජීවිතය අවසන් කර ස්වර්ගීය උත්පත්තිය ලබන නිසාය. ඒ ස්වර්ගීය උපත කරණකොට ගෙන මෙලොව ජීවතුන් අතර සිටින අප ස්වර්ගීය වරප්‍රසාද අපගේ ජීවිත තුළට ලබා දෙන ලෙස අයදිති. ඒ වරප්‍රසාද සමූහය නිසා අපි වාර්ෂිකව දේවස්ථානවල මංගල්‍ය ඒ සාන්තුවරයාට හෝ සාන්තුවරියට තුති පුදමින් සමරමු. මංගල්‍යය සමරන දිනට, දින නවයකට ප්‍රථම දේවස්ථානයේ කොඩි ගස ඔසවා, මුළු ජනතාවටම මංගල්‍යයක් සමරන බවට ඒත්තු ගන්වයි. ඒ කාලය ග්‍රාමවාසි ජනතාවට සතුටු විය හැකි කාල සීමාවකි. මේ සතුට අප ලැබිය යුත්තේ, ආධ්‍යාත්මිකවද ? නැතිනම් ශාරීරිකවද ? අප මෙය ආධ්‍යාත්මිකව සැමරිය යුතු, සතුටු විය යුතු කාල සීමාවකි. දින අටක් පුරා ගත කරන කාලය තුළ ගරු පියවරුන් වෙහෙස වන්නේ, කිතුනු ජනයාව ආධ්‍යාත්මිකව පෝෂණය කිරීමටයි. විවිධ මාතෘකා ඔස්සේ ජනතාවව සූදානම් කරන පියවරුන් තම ඇතුළාන්තය පිළිබඳව සෝදිසියක යෙදෙන්නට විශේෂ දිනයක් ලබා දෙයි. නමුත්, කනගාටුවට කරුණ නම්, පාපොච්චාරණය ඇසීමට ගරු පියවරුන් කැඳවා සිටියත්, ජනතාව එහි දක්නට නොලැබීමයි. අද බොහෝ කිතුනු ජනයා පව් කමාව නැමති උතුම් දේව ප්‍රසාද නිධානයට ඇතුළු වීමට මැලිකමක් දක්වති. බොහෝ අය එයට විවිධාකාර හේතු දක්වති. ඉන් කිහිපයක් මෙසේ සඳහන් කරණු කැමැත්තෙමි.

"අපේ පව් අපි ඇයි ෆාදර්ලට කියන්නේ ? ෆාදර්ලා ශුද්ධවන්තයෝද ?" "අපි ගිහින් පව් කිව්වා කියලා ෆාදර්ට පුළුවන්ද අපේ පව් මකන්න." "කොච්චර කොම්සම් කරත්, කියලා ඇවිල්ලා කරන්නෙත් ඒ පව් නේ. ඒ නිසා මොනවටද කොම්සම් කරන්නේ ? ඕක වැඩක් නෑ."

මෙවැනි විවිධ අසත්‍ය මෙන්ම හරයක් නොමැති විවිධ මතවාද නිසා හානි වන්නේ, රදගුරුතුමාගේ, පූජකවරුන්ගේ හෝ පැවිදි අයගේ අධ්‍යාත්මයට නොව, තමා විසින්ම තම ආධ්‍යාත්මිකත්වය හානි කර ගන්නා කිතුනු ජනයාටමය. මතක තබා ගත යුතු කරුණු නම්, අප අපගේ පාප උච්චාරණය සිදු කරනු ලබන්නේ, සුදු ලෝගුවකින් ශරීරය වසා ගත් මිනිස්කමකින් පිරුණු මිනිසකුට පමණක් නොව, දේව ආලේපය ලද ක්‍රිස්තුස් වහන්සේ වෙනුවෙන් මැදිහත් වන ශුද්ධවූ තැනැත්තකුටය. ඒ ශුද්ධවූ තැනැත්තා ගරු පියතුමන් ලෙස අප ඉදිරියේ වැඩ සිටිනුයේ,

ක්‍රිස්තුස් වහන්සේමය. එනිසා අප පාපෝච්චාරණය සිදු කරන්නේ, ක්‍රිස්තුස් වහන්සේටමය. අපගේ පව් කමා කරන්නේත් උන්වහන්සේමය. එසේ නම් මේ උතුම් විශ්වාසය කිතුනු අපගේ ජීවිතවලට බද්ධ කර ගනිමු. අරුත් බර මංගල්‍ය සමයක මූලික පිවිසුම සිත් සෝදිසිය හෙවත් පව් කමාවයි. දේවස්ථාන මංගල්‍යය ජයට සමරන්නට වෙර දරන සේම, නොමිලේ සිදු කර ගත හැකි ආත්ම සෝදිසියට සිත් යොමවා අපගේ ආධ්‍යාත්මික ජීවිතය සුවපත් කර ගන්නට වෙර දරමු.

පවුලක් ලෙස, ගමක් ලෙස සතුටු විය හැකි එක් දිනයකි, වාර්ෂිකව පැමිණෙන දේවස්ථානයේ මංගල්‍යය. දේවස්ථානයක් තුළ දුප්පත් මෙන්ම පොහොසත් පවුල්ද ජීවත් වන බවට සැකයක් නැත. මේ දෙපිරිසටම මංගල්‍යය සැමරීමට ඉඩ සැලසිය යුතුමය. නමුත්, අද සමාජයේ, සිදු වෙමින් පවතින්නේ, ඊට හාත්පසින් වෙනස් දෙයකි.

"නුඹලාගේ මංගල්‍යය වලට මම ද්වේෂ කරමි. ඒවා මට රුස්සන්නේ නැත. .. නුඹලාගේ ගීත ඝෝෂාව නතර කරන්න. නුඹලාගේ වීණා නාදයට මම සවන් නොදෙමි. යුක්තිය ගලා බහින දිය දහරක් මෙන්ද ධර්මිෂ්ඨකම නොසිඳී ගලන ගඟක් මෙන්ද පැවතිය යුතුය" (ආමෝස් 5:21-24).

අද සමාජයට ඉතා වලංගු කියමනක් ආමොස් දිවැසිවරයාගේ ග්‍රන්ථයෙන් ගෙන හැර දක්වයි. අද දෙවියන් වහන්සේ ජීවමානව, ශාරීරිකව අප අතර වැඩ සිටියහොත් මේ ප්‍රකාශය අද සමාජයට නියත වශයෙන්ම ප්‍රකාශ කරන බවට සැකයක් නැත. බෝහෝ විට කෑම බීම වැඩි පුර පොහොසත් අයට ඇති නිසා ඔවුන් සාර්ථක ලෙස මංගල්‍යය පවත්වනවා යයි සිතුවිල්ලක් කාට හරි ඇති විය හැකිය. එයද සාර්ථක දැයි ඇසිය යුතුමය. තමා හට මුදල් බලය තිබෙන බව පෙන්වමින් අනවශ්‍ය කටයුතු සඳහා මුදල් විය පැහැදම් කර බලාපොරොත්තු වන දෙය සම්බන්ධවද නැගෙනුයේ ප්‍රශ්නාර්ථයකි. වර්තමානයේ මංගල්‍යය පූර්ව රාත්‍රික මෙහෙය මෙන්ම මංගල්‍යය දින ප්‍රධාන දිව්‍ය යාගය දෙස බලන විට හුදු අධ්‍යාත්මිකත්වයකට එහා ගිය විලාසිතා මැදුරකට ජනයාව ඇතුළු වූවා සේ දැනීම අරුමයක් නොවේ. මක්නිසාදයත්, පැළඳ සිටින ඇඳුම් දේවස්ථානයකට සුදුසු දැයි සොයා බැලීමට තරම් කල් වේලාවක් ඒ ඇඳුම්වලින් සැරසී ඉන්නවිට නොතිබීම කනගාටුවට කරුණකි. මෙවැනි දෑ නෙත ගැටෙන විටත් දිව්‍ය යාගය මෙහෙයවන ගරු පියවරුන්ට තම ඒකාග්‍රතාව තබාගෙන උතුම් වූ මෙහෙය පවත්වන්නට වරම් ලැබීමම උතුම් දේවාශීර්වාදයකි. විවිධ වූ ඇඳුම් මෝස්තර, විවිධ විලාසිතා දකින ගමෙහි ජීවත් වන දුප්පත් ජනයා තුළ ඇති වන ශෝකය මෙන්ම කලකිරීම සංසිඳිය හැකි කවරෙක් හෝ සිටීද ? ගමම සතුටු වන මංගල්‍යයේ එක් පිරිසක් අසතුටින් සිටීම සාධාරණ දැයි මොහොතක් සිතා බලමු. මංගල්‍යය සමරන්න ඔබට මට තිබෙන ශාරීරික සූදානම ඔබේ මගේ ආධ්‍යාත්මික ජීවිතය පිරිසිඳු කර ගැනීමට තිබුණානම් එය දෙවිඳුන්ට ප්‍රසන්න වන බව නම් නොරහසකි. ශාරීරිකව සුන්දර ව සිටි නමුත්, ඇතුළාන්තය අපිරිසිඳු නම් සමරන කිසිදු මංගල්‍යයක අරුතක් නොමැත. අරුත්බර මංගල දිනක ආරම්භය වෙන කිසිවක් නොව ඇතුළාන්ත සිත් සෝදිසියම පමණයි. මොහොතක් සිතා බලන්න, ඔබෙ තේරීම නිවැරදි ද, කියා ? ඔබට වඩා වටිනුයේ, කෙදිනක හෝ පොළොවට පස් වී යන ශරීරයද ? දෙවිඳුන් ඉදිරියේ සිට ගැනීමට අවශ්‍ය කරන ආත්මික ජීවිතයද, කියා තීරණය ඔබ අතෙහිය.

වසරකට වරක් එළඹෙන මංගල්‍යය සමය ඔබේ මගේ ශාරීරික ජය පැන් මංගල්‍යයක් කර නොගෙන, ආධ්‍යාත්මිකත්වය රජයන, ආත්මය පිරිසිදු කර ගත හැකි මංගල මොහොතක් කර ගැනීමට උත්සාහ කරමු. එවිට ශාරීරිකව පමණක් සූදානම් වී අනිත්‍ය සිරුර හැඩ කරනවාට වඩා මුළු ආත්මයම පිරිසිඳු වී ඔබව කාහටත් ප්‍රසන්න පුද්ගලයෙක් වන බවට සැකයක් නැත. එසේ නම්, සමරමු දෙව් විමනේ මංගල්‍යය කිතුනු අපගේ අධ්‍යාත්මයට මුල් තැන දී. එවිට සුපහන් ජනයාගේ සුපහන් යැදුම දෙවිඳුන් වෙත එසවෙන බවට නොඅනුමානය. කිතුනුවන් ලෙස වෙර දරමු ශාරීරිකව සූදානම් වන මංගල මොහොතකට වඩා ආධ්‍යාත්මිකව සූදානම් වී ඒ මොහොත අරුත්බරව සමරන්නට. එවිට ලෞකික සුන්දරත්වයට වඩා ආත්මික සුන්දරත්වය තුළ සුන්දර මංගල්‍යය කාලයක් සමරන්නට කිතුනුවන් ලෙස ඔබට මට හැකි වන බව නිසැකය.

"මංගල සමයයි - හැඩ වැඩ කෝටියයි
කළු වුණු ඇතුළයි - හැඩ වුණු එළියයි
සමරමු ඇතුළින් - සුදු වුණු හිතකින්
මේ අපගේ මංගල සමයයි ..... "

**බුද්ධික සඳරුවන්**
ශා. ඇලෝසියස් දෙව්සත්හල, කොළඹ 08.

# පුංචි විකුම්

# ළමා ප්‍රබෝධනය



## ආදරයේ මංගල්ලේ ...

ඇතින් ඇසෙන ගීතිකා නාදය දසුන්ගෙ හිමිදිරිය අලුත් උද්‍යෝගයකින් පිරෙව්වා. පල්ලියෙ මංගල්‍යය නිසා මේ දවස්වල ගම පුරා නිතරම ගීතිකා ඇහෙනවා. පූජාව පවත්වන හඬ ඇහෙනවා. මංගල්ලෙ කාලෙ කියන්නෙ ගමම වසන්ත සිරියකින් අලුත් වෙන කාලයක්. පල්ලිය, පල්ලිය වත්ත විතරක් නෙවෙයි ගමේ වීදි, ගෙවල් දොරවල් පවා අලුත් වෙනවා. පිළිවෙළ වෙනවා. ලස්සණ වෙනවා.

දවස් අටක්ම එක දිගට නොවාන තිබුණා. දසුන් අම්මත් එක්ක හැම නොවානයකටම නොවරදවා ගියා. තාත්තා හදවත් රෝගයකින් අකාලෙ නැතිවුණාට පස්සෙ අම්මටයි, දසුන්ටයි තිබුණු එකම පිළිසරණ දහම තමයි. පල්ලිය කැප කරල තිබුණෙ සාන්ත ආනා මෑණියන්ට. ජේසුගෙ අත්තම්මට. ඒ නිසාමද මන්ද පල්ලියට ගියාම තමන්ගෙම ආච්චි අම්මා ළඟට ආවා වගේ හැඟීමක් දසුන්ට දැනුණා. බොහෝ අගහිඟකම් මැද තමයි ඒ දෙන්න ජීවත් වුණේ. අම්මා ගෙදරක වැඩ කරල දසුන්ට ඉගැන්නුවෙ. ඉතින් අනික් දරුවන්ට දෙමව්පියන්ගෙන් ලැබෙන බොහෝ දේවල් දසුන්ට ලැබුණෙ නෑ. එයා අම්මට කරදර කළෙත් නෑ. පුංචිම කාලෙ ඉඳල ලැබෙන දෙයින් සැනසිලා ජීවත් වෙන්නත්, හැකි විදියට අම්මට උදව් වෙන්නත්, හැම මොහොතකම හිනාවෙලා ඉන්නත් දසුන් පුරුදු වුණා.

පල්ලියෙ මංගල්ලෙ එනකල් දසුන් බලන් ඉන්නෙ කාලයක් තිස්සෙ. ඒ මංගල්ලෙ කඩ වීදියෙන් වයින් කරන රතු කාර් එකක් ගන්න. දසුන් ගිය අවුරුද්දෙ මංගල්ල පොළෙන් තමයි ඒ කාර් එක දැක්කෙ. රුපියල් දෙදාහක් කියල කියද්දි අම්මට හීල්ලුණත් එක්ක. එදා ඒ කාර් එක අරන් දෙන්න අම්ම ළඟ සල්ලි තිබුණෙ නෑ. පුංචි ප්ලාස්ටික් කාර් එකකිනුයි, අයිස්ක්‍රීම් එකකිනුයි සැනසෙන්න දසුන්ට සිද්ධ වුණා.

ඉතින් දසුන් එදා ඉඳන් වයින් කරන රතු කාර් එකක් ගන්න සල්ලි එකතු කළා. පරණ පත්තර විකුණල, ඉඳහිට ලැබෙන මුදල් කැටයකට දාල, පුංචි වගාවක් කරල. මේ විදියට එකතු වුණ සල්ලි රුපියල් පන්දාහක් දසුන් ළඟ තිබුණා.

උදේ අවදි වුණු දසුන් කුස්සියට යද්දි අම්මා හරිම අපහසුවෙන් වාඩි වෙලා ඉන්නවා. අම්මා හුස්ම ගන්නෙත් අමාරුවෙන්. පපුවෙ මහන්සිය වැඩි වුණාම අම්මට ගොඩක් අමාරු වෙනවා. සමහර කාලවල අම්මා හුස්ම ගන්නවා නෙවෙයි හුස්ම අදිනවා. දසුන්ට බය හිතුණා.

''අම්මෙ අපි බේත් ගන්න යමු. මම නිමල් මාමගෙ ත්‍රීවීල් එකට එන්න කියන්නම්."


''එපා පුතේ... අපි ටිකක් බලමු. මගෙ අතේ සල්ලිත් නෑ." අම්මා අමාරුවෙන් කිව්වා. අම්මා දසුන්ගෙ ඉස්කෝලෙ පොත් ටික ගන්න ගොඩක් සල්ලි වියදම් කළා. ඒ නිසා අම්මට උවමනා කරන බෙහෙත් ගන්න බැරිවෙන්නත් ඇති. අම්මා එහෙම වැඩ කරනවා. දසුන්ගෙ ඉගෙනීම ගැන බලල තමයි අනිත් වැඩ කරන්නෙ. කන බොන දේටත් කලින් අධ්‍යාපනයට සල්ලි වෙන් කරන්න තමයි අම්මට ඕනෙ. ඒත් මෙහෙම බෙහෙත් නොගෙන ඉන්න එක හොඳ නැති බව දසුන් දන්නවා. පුංචි හිතට මහා බයක් දැනුණා.

''මං ළඟ සල්ලි තියෙනවා අම්මේ. අපි බෙහෙත් ගන්න යමු." දසුන් ත්‍රීවීල් එකක් හොයන් එන්න දුවද්දි, ''අනේ මගෙ පුතා" කියල අම්ම කෙඳිරි ගානවා ඇහුණා.

'කමක් නෑ කාර් එකක් මට ලබන අවුරුද්දෙත් ගන්න පුලුවන්' දුවන අතරෙම දසුන් හිතුවා. පුංචි දුකක් නොදැනුණාමත් නෙවෙයි. ඒත් ඉක්මණින්ම හිත හදාගන්න එයාට පුළුවන් වුණා. වඩා වටින්නෙ අම්මගෙ ජීවිතේ. දසුන් වගේ පුංචි වීරයෙක් ඉන්න ඒ අම්මා කොයිතරම් වාසනාවන්තද...!

තරු නැන්දා

## ප්‍රහේලිකා අංක - 79



**පහළට**

1. බොහෝ මංගල්‍යයන් පැවැත්වෙන්නේ දේව වන්දනා කැලැන්ඩරයේ මේ කාලයේදීය.
2. ගස් වැල්
3. ඇද වූ
4. ඊශ්‍රායෙල්වරුන්ගේ ශ්‍රේෂ්ඨතම මංගල්‍යය මෙනමින් හැඳින්වේ.
5. විනාශ වී යනවා, මැරෙනවා යන අරුත්දේ.
9. සැම මංගල්‍යයකටම පෙර මෙය සිදු කිරීම වැදගත්ය.
11. ආබ්‍රහම් තුමාගේ මුල් භූමිය.
14. ශ්‍රී ලංකාවේ පැරණිතම මිනිරන් පතල.
17. මාර්ග සංඥාව
20. "වරම" යන්නට සමාන අරුත් දේ.
23. ඛනිජයක් ලෙස පවතින ටයිටේනියම් ඩයොක්සයිඩය.
24. "නැති බව"
26. දෙවියන්ට අයත්

**හරහට**

1. බොහෝ දේවස්ථාන මංගල්‍ය සිදු කරනුයේ මොවුන් සිහිපත් කරමිනි.
6. "ශාක" යන්නට සමාන වචනයකි.
7. නොපැසුණු
8. මේ දිනවල දේශපාලන වේදිකාවේ කතාබහ වන විස්තීර්ණ ආර්ථික සහයෝගිතා ගිවිසුම මේ නමින් හැඳින්වේ.
10. මුහුණේ කොටසකි.
12. හුණුගල්, බෙලිකටු ආදිය පිලිස්සීමෙන් ලැබෙන සුදු ද්‍රව්‍යය.
13. ක්‍රිස්තුස් වහන්සේගේ අන්‍යරූප විලාසවීම සිදු වූයේ.
15. මිහිරි රසැති පලතුරකි.
16. පංච ඉන්ද්‍රියයන්ගෙන් එකකි.
18. ගෙදර දොරේ භාවිත වන ආයුධයකි.
19. "මං සන්ධිය" .
20. "වාරය" යන්නට සමාන අරුත් දේ.
21. "කීර්තිය"
22. මිනිසුන් දෙවියන් වෙත පුදන්නේ.
24. දේවස්ථාන මංගල්‍යවල අනිවාර්ය අංගයකි.
25. ළමයින්ගේ ක්‍රීඩාවකි.
26. ළඳ බොළඳ, අතිශයින් මොළොක්, සියුමැලි යන පදවලට සමානය.
27. යුද්ධය පිළිබඳ.
28. පැරණි ගිවිසුමේ සඳහන් පූජකයෙකි.

**ගරු චාමික සුදර්ශන නිමනි පියතුමා**
**මැසනඩ් ඉංග්‍රීසි අධ්‍යාපන ආයතනය**
**කටුවපිටිය, මීගමුව.**

ප්‍රහේලිකාව සඳහා ඔබගේ පිළිතුරු තැපැල්පතක පමණක් ලියා පහත ලිපිනයට, 2024 මැයි 31 ට පෙර තැපැල් කරන්න. ජයග්‍රාහකයන් අතුරින් කුසපත් ඇද තෝරා ගත් තිදෙනකුට මුදලින් තෑගි පිළිවෙලින්, රු.2000.00, රු.1500.00, රු.1000.00 බැගින් පිරිනැමේ. ***විශේෂ මතක් කිරීමක් - ප්‍රහේලිකාවේ විසඳුම් එවන විට ඔබේ නම, පන්තිය, පාසල, පාසලේ සහ නිවසේ ලිපිනය සඳහන් කර එවන්න.***

**ප්‍රහේලිකා අංක - 79**
**"ළමා භක්ති ප්‍රබෝධනය", අංක 265, ඩීන්ස් පාර, මරදාන, කොළඹ 10.**

## ප්‍රහේලිකා අංක 77 - පිළිතුරු

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 ඇ | ද | හි | ල් | 2 ල | | 3 තො | පෙ | තෙ | 4 න |
| ත් | | | | 5 ප | 6 නි | ති | | | ම |
| 7 යෝ | 8 ක | ෂ් | ණ | | 9 වෛ | ර | 10 හැ | 11 ර | |
| 12 ලා | වා | | | 13 ක | ද | | 14 ව | යි | න් |
| 15 ව | ඩි | 16 ග | ප | වූ | න | | | බො | |
| | | ළි | | වා | | 17 ම | හ | යෝ | ණ |
| 18 ව | රි | ග | | න | | ස් | | ම | |
| | | 19 මු | ව | | 20 අ | ක | ල | | 21 ප්‍රා |
| 22 ප | 23 තා | ව | | 24 බී | රු | වි | | 25 ඇ | ණ |
| 26 යා | සා | | 27 ක | ම | ත | | 28 ප්‍රේ | ම | ය |

## ආදරණීය දරුවනි

"ළමා ප්‍රබෝධනය" ට
ඔබගේ ලස්සණ නිර්මාණ,
කවි, ගීත, නිසඳැස්,
කෙටිකතා, ලිපි, ආදිය ලැබීමට
අපි බොහොම කැමැත්තෙන් සිටිමු.
ඔබ එවන ඒ නිර්මාණය සමග
පන්තිභාර ගුරුතුමාගේ හෝ
ගුරුතුමියගේ
අත්සන ඇතිව අප වෙත එවන්න.

**සංස්කාරක පියතුමා.**
**"භක්ති ප්‍රබෝධනය"**
**265, ඩීන්ස් පාර, මරදාන,**
**කොළඹ 10.**
Email: bhakthi.prabodhanaya@gmail.com

## ප්‍රහේලිකා අංක 77 ජයග්‍රාහකයෝ

දයාබර දරු දැරියනී,

ප්‍රහේලිකා අංක 77 සම්පූර්ණ කර අප වෙත එවූ සැමටම ස්තුති කරමු. නිවැරදි පිළිතුරු එවූ දරු දැරියන් අතුරින් පහත නම සඳහන් දරුවා ජයග්‍රහණය කර ඇත. සහභාගි වූ සියල්ලන්ටම සුබ පතන අතර ත්‍යාග ලාභියා වෙත ත්‍යාගය යථා කාලයේදී පාසැලේ විදුහල්පතිතුමා හෝ විදුහල්පතිතුමිය මගින් ලැබෙන බව කරුණාවෙන් සලකන්න.

**නිවැරදි පිළිතුරු එවා ජයග්‍රහණය කළ දරුවෝ**

- **පළමු ස්ථානය - රයන් මෙන්ඩිස්, 10 A, ලොයලා විදුහල, බෝපිටිය.**
- **දෙවන ස්ථානය - ජයග්‍රහණය කර නැත.**
- **තෙවන ස්ථානය - ජයග්‍රහණය කර නැත.**

## භක්ති ප්‍රබෝධනය ඉදිරි තේමා

**2024 ජූලි / අගොස්තු - "බලය"**
(ජූලි - අගෝස්තු කලාපය සඳහා ඔබ එවන ලිපි මැයි 15 ට පෙර අප වෙත එවන්න.)
**2024 සැප්තැම්බර් / ඔක්තෝම්බර් - "නායකයෝ"**
(සැප්. - ඔක්. කලාපය සඳහා ඔබ එවන ලිපි ජූලි 15 ට පෙර අප වෙත එවන්න.)

# කතෝලික ධර්මය
## ආදර්ශ ප්‍රශ්න පත්‍රය - II වන කොටස
## අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2024

සියලු ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

01. (i) දේව වේදීය ඉතිහාස කතා ලෙස හඳුන්වන්නේ කුමක් ද?
(ii) ලේඛනගත වීමට පෙර දේව වචනය පරම්පරාවෙන් පරම්පරාවට පැවත ආවේ කෙසේ ද?
(iii) ශු. ලූක් තුමා රචනා කළ ග්‍රන්ථ 2ක් නම් කරන්න.
(iv) අපොස්තලික යුගයේ දී ශුද්ධ වූ සභාවට මහගු සේවයක් කළ විශිෂ්ට පුද්ගලයකු ලෙස හැඳින්වූයේ කවු ද?
(v) නව ගිවිසුමේ වෙනත් හසුන් සඳහා භාවිත කර ඇති වෙනත් නම් 2ක් ලියන්න.
(vi) එළිදරව්ව සාහිත්‍යයේ එන බැටළුවා සහ මකරා යන සංකේතවලින් අර්ථ දක්වන්නේ කුමක් ද?
(vii) පුරාණ ගිවිසුමේ ජන වන්දනාවට අදාළ නීති නියෝග පිළිබඳව සඳහන්ව ඇත්තේ කුමන ග්‍රන්ථයේ ද?
(viii) පංච පුස්තකය සඳහා යෙදෙන හෙබ්‍රෙව් නාමය කුමක් ද?
(ix) එලෝහිම් සම්ප්‍රදායට අයත් සිදුවීම් 2ක් නම් කරන්න.
(x) ද්විතීය නීති සංග්‍රහය පොතට පමණක් සීමා වී ඇති සම්ප්‍රදාය කුමක් ද?

02. (i) දෙවියන් වහන්සේට පක්ෂපාත වී උන්වහන්සේගේ වචන අනුව ජීවත් විය යුතු බව ප්‍රකාශ කරන ග්‍රන්ථය කුමක් ද?
(ii) පංච පුස්තකය හඳුන්වන වෙනත් නම් 3ක් ලියන්න.
(iii) පංච පුස්තකයේ අඩංගු වී ඇති කරුණු 5ක් විස්තර කරන්න.

03. (i) කතෝලික සභාවට අනුව පුරාණ ගිවිසුමේ සම්මත ග්‍රන්ථ ගණන කීය ද?
(ii) දිවැස් වැකි කීමේ දී භාවිත කළ තුන් ආකාරයේ පද මාලාව කුමක් ද?
(iii) ඔබ ජීවත්වන සමාජයට දිවැසිවරයකු ලෙස ජීවත්වන ආකාරය කරුණු පහකින් විස්තර කරන්න.

04. (i) සෙනග විනිශ්චය කරන පිණිස හොඳ නරක දැනගන්න පුළුවන් වන ලෙස ඥානවන්ත සිතක් ඉල්ලා යාච්ඤා කළ රජතුමා කවු ද?
(ii) පුරාණ ගිවිසුමේ ප්‍රඥා සාහිත්‍ය ඉදිරිපත් කර ඇති සාහිත්‍යමය ස්වරූප 3ක් ලියන්න.
(iii) ඔබේ ජීවිතයේ ප්‍රඥාවන්තව කටයුතු කළ හැකි අවස්ථා 5ක් ලියා දක්වන්න.

05. (i) දේශක දිවැසිවරුන්ගේ වචන හා ක්‍රියා ඇතුළත් පුරාණ ගිවිසුමේ ග්‍රන්ථ 2 ක් නම් කරන්න.
(ii) දේශක දිවැසිවරුන්ගේ ලක්ෂණ 3ක් ලියන්න.
(iii) කිතුනු සිසුවකු ලෙස පාසල තුළ ඔබ විසින් දිවැසිවර කාර්යය ඉටු කරන ආකාරය කරුණු 5 කින් විස්තර කරන්න.

# කතෝලික ධර්මය
## පිළිතුරු පත්‍රය

01. (i) පුරාණ ගිවිසුමේ ඉතිහාස පොත් ය.
(ii) වාචික සම්ප්‍රදායෙනි.
(iii) ශු. ලූක් සුබාරංචිය සහ ක්‍රියා පොත
(iv) ශුද්ධ වූ පාවුලු තුමා
(v) කතෝලික සන්දේශය/ විශ්ව සන්දේශය/ සාමාන්‍ය හසුන්
(vi) බැටළුවා - ක්‍රිස්තුන් වහන්සේ
මකරා - යක්ෂයා, පීඩාකාරී බලවේග
(vii) ලෙවී ව්‍යවස්ථාව
(viii) ටෝරා
(ix) ඊසාක් පූජා කිරීම/ ජාකොබ් තුමා බෙතෙල්හි දුටු දර්ශනය
(x) ද්විතීය නීති සම්ප්‍රදාය

02. (i) ද්විතීය නීති සංග්‍රහය
(ii) නීතිය/ ව්‍යවස්ථාවලිය/ මොසෙස් තුමාගේ ව්‍යවස්ථාව
(iii) විශ්වයේ ආරම්භය/ මිනිසා මවනු ලැබීම/ මිනිසා පාපයට වැටීම/ දෙවියන් වහන්සේ ආදිපියවරුන් තෝරාගැනීම/ ඊශ්‍රායෙල්වරුන් ඊජිප්තුවේ වහල් බාවයට පත් වීම.

03. (i) 46
(ii) 1) ''සමිඳාණන් වහන්සේ මෙසේ වදාරන සේක.''
2) ''මෙසේ වදාරන්නේ සමිඳාණන් වන මමය.''
3) ''සමිඳාණන් වහන්සේගේ පණිවිඩය ........ වෙත පැමිණියේය.''
(iii) සිසු අදහස්

04. (i) සලමොන් රජතුමා
(ii) ප්‍රස්තා පිරුළු/ උපදේශ/ කතාන්දර/ සංකල්පනා/ ගීත
(iii) සිසු අදහස්

05. (i) 1, 2 සාමුවෙල් 1,2 රාජාවලිය
(ii) ධ්‍යානයට සම වැදීම/ කණ්ඩායම් වශයෙන් මෙහෙවරෙහි යෙදීම/ තම දූත මෙහෙවර සනාථ කිරීම සඳහා හාස්කම් කිරීම.
(iii) සිසු අදහස්

**ජේ. ඒ. එල්. ශ්‍රීමති සිල්වා මෙනවිය.**
විදුහල්පතිනිය - මිනු/ පහළ මඩම්පැල්ල කනිෂ්ඨ විද්‍යාලය - කටාන.







# නව ගිවිසුම හා සුබාරංචි ලේඛන ගතවීම III
## අ.පො.ස. (උ.පෙළ) ක්‍රිස්තියානි ධර්මය/ශිෂ්ටාචාරය සඳහා අත්වැලක්
## නව ගිවිසුම් සමයේ ජුදා සමාජ ප්‍රභේද

ජුදා සමාජ පසුතලයේ කුලවන්තයන් සම්බන්ධයෙන් පසුගිය කලාපයෙන් සාකච්ඡා කළෙමු. එතැන් සිට ඉදිරියට අනික් සමාජ කණ්ඩායම් කෙරෙහි අධ්‍යයනය කිරීමට බලාපොරොත්තු වේ.

### මධ්‍යම පාන්තිකයන්

ජුදා සමාජ පසුබිමේ ඉදිරියෙන්ම සිටින පිරිස ධනවත්තු වෙති. සමාජයේ දෙවන බල ස්තරය මධ්‍යම පාන්තිකයන්ය. මොවුන් අතර පූජක පක්ෂයට අයත් කණ්ඩායම්, සුළු පරිමාණ ව්‍යාපාරිකයන්, ගෘහ නිර්මාණ ශිල්පීන්, කලාකරුවන් වැනි පිරිස් අයත් වේ. එම මධ්‍යම පාන්තිකයන්ගේ ආදායම් මාර්ග බොහෝ විට ජෙරුසලම් දේව මාලිගාව හා සම්බන්ධ වේ. ජෙරුසලම් මංගල්‍යය වකවානුවලදී මොවුන්ට විශේෂ ආදායම් මාර්ග හිමිවේ. පූජක වංශ අතර ජෙරුසලම් දේව මාලිගාවේ තේවා කරන පූජකයෝ මධ්‍යම පන්තියට අයත් නොවෙති. ඔවුන් ධනවතුන්ය. සෙසු පූජක වංශ මධ්‍යම පන්තියට අයත් වේ. පූජකවරුන්ට තම තේවාවලදී ලැබෙන පඬුරු, නැඹුල්පල, සහ භූමියේ වගාවෙන් 1/10 ක් ලැබුණි. මේ අය දිළිඳු දිවිපෙවෙතක් ගත නොකළ අතර සුඛෝපභෝගි ජීවිතයක්ද නොවීය.

### කොන්කරනු ලැබූවෝ

ජුදා සමාජ ප්‍රභේද අතර මොවුන් විශේෂ කණ්ඩායමකි. ක්‍රිස්තුස් වහන්සේ ජීවත්ව සිටි කාලයේ කොන්වූවන් කෙරෙහි එතුමාගේ විශේෂ සැලකිල්ල හිමි විය. මොවුහු වහලුන්, බදු අයකරන්නන් සමාරියයන් රෝගීන්, කාන්තාවන්, එඬේරුන්, යනාදි සමාජ කණ්ඩායම් ලෙස පෙන්වා දිය හැක.

### වහල්ලු

පලස්තීනයේ වහල් වෙළෙඳාම ආරම්භ වුවායයි පැවසෙන්නේ ක්‍රි.පූ. 3 වන සියවසේ පමණ සිටය. ග්‍රීක් අධිරාජයා පලස්තීන අත්පත් කරගන්නා ලද්දේ ක්‍රි.පූ. 333 දීය. වහල් වෙළෙඳාම ඒ යුගයේ ආරම්භ වුයේ යැයි සිතිය හැකිය. යුද්ධ පරාජය හමුවේ රැකෙන එන වහල්ලුන් ගලක් මත හිඳුවා වෙන්දේසි කරනු ලබති. වහලා වෙළෙඳ පොළෙන් මිලදී ගත හැකි භාණ්ඩයක් ලෙස සැලකිණ. යම් අයකු තව අයකුට ණය වූ විට ඒ ණය මුදල නැවත දීමට අපොහොසත් වුවහොත් ණය මුදලට ගෙවීමක් ලෙස තමන්ව වහලකු ලෙස විකිණීම සිදු විය. කෙනකු තමන් අනාථ භාවයට පත්වුයේ නම් තමන්ව වහලකු ලෙස විකිණිය හැකිය.

තාල්මුඩ් නීතියට අනුව ජුදා වහලකු විකුණා දැමිය හැක්කේ තඹ කාසි 1 හෝ 2 කටය. එහෙත් අන්‍ය ජාතික වහලකු විකුණා දැමිය හැක්කේ තඹ කාසි 5-10 අතර මිලකටය. වහලකු තම ස්වාමියාට සේවය කළයුතු වසර ගණන 6 කි. ඉන් පසු ඔහු නිවහල් වේ. ජුදා වහලියක් අවුරුදු 12 කින් පසුව නිදහස් වුවත් තම ස්වාමියා ඇයව සරණපාවා ගන්නේ නම් ඇය දිගටම වහලියක් ලෙස ජීවත් වේ. නිවසට පිටතින් එන සියලු දෙනාගේ පාද සේදීම වහලා කළ යුතුය.

ක්‍රිස්තුස් වහන්සේ සැම විටම වහල් බවින් මිනිසුන්ව නිවහල් කිරීමට තම ඉගැන්වීම් තුළින් උත්සාහ ගත්තේය (මතෙව් 10/24). ශුද්ධවූ පාවුලු තුමාද (පිලමොන් 1/15-16) ඔනේසිමස් යන වහලා සම්බන්ධව කථා කරයි.

### බදු අයකරන්නෝ

මේ කණ්ඩායම සුංගම් අයකරන්නන්, අයකැමියන් ලෙසද හැඳින්වේ. මොවුන් විසින් රෝම අධිරාජයා වෙනුවෙන් බදු අයකරන ලදී. බදු අය කිරීමේදී සාධාරණ බවකින් තොරව අසාධාරණ ලෙස මොවුන් කටයුතු කර ඇත. එනිසා ජුදාවරු අයකැමියන්ව ප්‍රතික්ෂේප කළහ. ඔවුන්ව ජාති ද්‍රෝහීන් යයි සැලකූහ.

එහෙත් ජේසුස් වහන්සේ අයකැමියන්ව ප්‍රතික්ෂේප නොකළේය. ඔවුන්ටද දේවරාජ්‍යය උරුම බව පෙන්වූහ. සකේවුස් නැමති අයකැමියාගේ නිවසට ගොස් ආහාර වැළඳූහ (ලූක් 19/1-10). සකේවුස් නැමති අයකැමියා ක්‍රිස්තුස් වහන්සේගේ ශ්‍රාවකයකු ලෙසද තෝරා ගැනිණි.

### සමාරියන්

ක්‍රි.පූ. 722 දී අසිරියානු අධිරාජයා පැමිණ පලස්තිනයේ උතුරු ප්‍රදේශය ආක්‍රමණය කළේය. පසුව පලස්තීනයේ උතුරු රාජ්‍යයේ විසූ ජනතාවගේ කොටසක් අසිරියාවට රැගෙන ගොස් ඒ දේශයේ පදිංචි කරන ලදහ. අසිරියාවේ සිටි යුද්ධ සිරකරුවන්ගෙන්

පිරිසක් පලස්තීනයට ගෙනවිත් ෂෙකෙම් දේශයේ පදිංචි කරන ලදහ. පසුකාලයේදී තම අචර්මච්ඡේදිත වූවන් සහ ජුදාවරුන් අතර ආවාහ විවාහ සිදුවීමෙන් පසු ඒ පරම්පරාව සමාරියන් යයි සැලකුහ. සංකර ජාතියකැයි සැලකුහ. ජුදා වරුන් සමාරිය දේශය හරහා ගමන් කිරීම පවා ප්‍රතික්ෂේප කළේය (2 රාජා 17).

ක්‍රිස්තුස් වහන්සේගේ කාලය වන විට ජුදා වරුන් හා සමරියානුවරුන් අතර විරසකය වර්ධනය වී තිබුණි. ජේසුස් වහන්සේ ඒ තත්ත්වය සමථයට පත්කිරීමට නිරන්තර උත්සාහයක යෙදුණහ. උදා-: යහපත් සමරිතානුවරයා පිළිබඳ උපමාව, සිකාර් නම් නුවර ජාකොබ්ගේ ළිඳ අසල දී සමරිතානු ස්ත්‍රියගෙන් ජලය ඉල්ලා පානය කළහ (ජොහාන් 4/1-42).

**රෝගීහු**

කිසියම් අයකු රෝගියකු බවට පත්වන්නේ ඔහු හෝ ඇය කරන ලද පාප කරණකොටගෙන හෝ ඔහුගේ පරම්පරාවේ අයගේ පාප නිසා හෝ බැවිනි. පාපයට දෙවියන් වහන්සේ දුන් දඬුවම හේතුවෙන් ඔවුන් රෝගීන් බවට පත්වී ඇත. ජුදාවරුන් තුළ පැවතියේ එවැනි මතයකි. ලාදුරු රෝගින්, කුෂ්ඨ රෝගින්, මී මැස්මොර රෝගින් යන අය දෙවියන් වහන්සේගෙන් සාප ලත් අය ලෙස හැඳින්වූහ. ඔවුන්ව සමාජයෙන් වෙන් කර තැබිණි. ඔවුන් ජීවත් වූයේ ජනතාව නොගැවසෙන ස්ථානවලය. එවැනි රෝගින් ස්පර්ශ කිරීම තුළින් අන් අයද අපිරිසිඳු වන බව ජුදා පිළිගැනීම වේ. යම් හෙයකින් රෝගියකු මග තොට ගමන් කරන්නේ නම් ඒ බව අන් අයට දැනගන්න පිණිස සීනුවක් නාද කරමින් ගමන් කළ යුතුය. රෝගියකු ඒ රෝගයෙන් සුවය ලැබුවේ නම් නායක පූජකයා වෙත ගොස් ඒ බව ඔහුට පවසා සහතිකයක් ලබා ගැනීමෙන් පසුව ඔහුට සමාජ ගත විය හැකිය.

එහෙත් රෝගින් සම්බන්ධව ජේසුස් වහන්සේගේ පිළිවෙත ජුදාවරුන්ට වඩා වෙනස්ය. රෝගින් ස්පර්ශ කිරීම නීතියෙන් තහනම් දෙයකි. ක්‍රිස්තුස් වහන්සේ රෝගින්ව ස්පර්ශ කර ඔවුන්ට සුවය දුන්හ. උදා: ලාදුරු රෝගින්ට සුවය දීම (ලූක් 17/11-19) ක්‍රිස්තුස් වහන්සේ පරිසිවරුන්ගේ හෝ විනයධරයන්ගේ නීති නොතකා සබත් දින පවා රෝගින්ට සුවය ලබාදීමට ක්‍රියා කර ඇත. මහලේ රෝගයෙන් (කිලිමාලයෙන්) පෙළුණු ස්ත්‍රියට (ලූක් 8:43) තමන්ගේ සළුව ස්පර්ශ කිරීමට ඉඩ දුන්හ. මේ අනුව ස්වාමීන් වහන්සේ රෝගින් කෙරෙහි අනුකම්පාවෙන් ඔවුන්ට කරුණාව දැක්වූ සේක.

**කාන්තාවෝ**

ජුදා සමාජයේ කාන්තාවන් බොහෝ විට නිවසට වී සිටියහ. සමාජය තුළ ගැවසීම නොහොබිනා කටයුත්තක් ලෙස සැලකුහ. දැඩි පුරුෂාධිපත්‍යයට කාන්තාව ලක් විය. ඇයගේ කටයුත්ත වූයේ දරුවන් ප්‍රජනනය කිරීමත් ගේ දොර වැඩ කටයුතු කිරීමත් පමණකි. සමාජය තුළ කාන්තාව ඉසුලුවේ පහත් තැනකි. කාන්තාවන්ට අයිතිවාසිකම් හිමි නැත. අධිකරණයකදි සාක්ෂි දීමට ඇයට නොහැකිය. දික්කසාද වීමේ අයිතිය පුරුෂයාට ඇත. එහෙත් කාන්තාවට එවැනි අයිති නැත. අධ්‍යාපනය ලැබීම රැකියාවක නිරත වීම කාන්තාවට අකැපය.

කාන්තාවක් වැන්දඹුවක් වූ කල ඇය ඉතාම අසරණවේ. ඇය තම වැඩිමහල් පිරිමි දරුවාගේ රැකවරණය යටතේ සිටිය යුතුය. පලස්තීනයේ කාන්තාවන් හට නිවසින් බැහැරව මග තොටේ පිරිමි අය සමග කථා කිරීමට නොහැකිය. ඔවුන් නිවසින් බැහැර වනවිට හිස හා මුහුණ වසාගෙන ගමන් කළ යුතුය. පිරිමින් හා එක්ව එකට වාඩිවී ආහාර අනුභව කළ නොහැකිය. කාන්තාව ඔවුන්ට උපස්ථාන කළ යුතුය. දේව මාලිගාව හෝ සිනගෝගයට ගිය විට කාන්තාව සඳහා විශේෂ ස්ථාන ඇත. වෙනත් ස්ථානවල ගැවසිය නොහැකිය. නිවසට යන එන පුද්ගලයන්ගේ පාද සේදීම පවා ඇය කළ යුතුය.

එහෙත් ක්‍රිස්තුස් වහන්සේ කාන්තාව සම්බන්ධව දරන ලද්දේ ඉතා කාරුණික ආකල්පයකි. ඉගෙන ගැනීමට කාන්තාවට තහනම් වුවත් ක්‍රිස්තුස් වහන්සේ කාන්තාවන්ට ඉගැන්වූ සේක. උදා: බෙතානියේ දී මාර්තා සහ මරියාට නිවසේදී ඔවුන්ට ඉගැන්වීම (ලූක් 10/38-42) සමාරිය ස්ත්‍රියගෙන් වතුර ඉල්ලා සිටීම. වැන්දඹුවගේ දරුවා මිය යාම තුළින් වැන්දඹුව තවත් අසරණ වන නිසා ඒ දරුවාව මළවුන්ගෙන් නැගිටුවීම. මේ අනුව පෙනී යන්නේ ක්‍රිස්තුස් වහන්සේ කාන්තාවන් කෙරෙහි දැඩි අනුකම්පාවක් සහ කරුණාවක් දැක්වූ බවය. උන්වහන්සේ සැමවිටම කාන්තා අයිතිය ලබා දීමට කැපවී ක්‍රියා කළ සේක.

සටහන

**ශාස්ත්‍රපති එස්. හේමාල් පෙරේරා**


TRANSWORLD GLS
CARRYING CARGO WITH CARE
A subsidiary of
TRANSWORLD GROUP SINGAPORE
Air Freight
Liner Agency
Supply Chain Solutions
Sea Freight
Inland Logistics
ISO Tanks
Projects
10 countries
36 offices
BLPL SINGAPORE
BLPL FAITH
BLPL
BEST COMPLIMENTS FROM
TRANSWORLD GLS (LANKA) PVT LTD
Ceylinco Houe, No 69. 8th Floor, Janadhipathi Mawatha, Colombo 01, Sri Lanka T.P +94 11 7634170/77 FAX +94 11 2481020
OUR PRESENCE
SINGAPORE VIETNAM
MALAYSIA INDIA
MYANMAR SRI LANKA
THAILAND CHINA
INDONESIA AFRICA

# කුරුණෑගල ජෝසප් වාස්

## උසස් අධ්‍යාපන ආයතනය මගින් මෙහෙයවනු ලබන

# ද්වීමාසික පූර්ණ ඉංග්‍රීසි නේවාසික පාඨමාලාව

ව්‍යාකරණ, කථනය, භාෂා උච්චාරණය, ලිවීම, සවන්දීම පිළිබඳව ප්‍රමාණවත් දැනුම් සම්භාරයකින් සිසු සිසුවියන් සන්නද්ධ කරවන ද්වී මාසික පූර්ණ ඉංග්‍රීසි පාඨමාලාව

**සදාචාරාත්මක පැවතුම් සහ යහපත් ආකල්පයන්ගෙන් සිසු සිසුවියන්ගේ ජීවිත හැඩගැන්වීම සඳහා:**

**භාවාත්මක ඥානය විකාශ කරවීම**
(Emotional Intelligence)

**නායකත්ව පුහුණුව**
(Leadership Training)

**සමාජ චාරිත්‍ර විධි පිළිබඳව අවබෝධය**
(Social Etiquttes)

**උපදේශණය**
(Counselling)

**ජීවිත ආරක්ෂණය**
(Life Saving)

**කෘෂිකාර්මික පුහුණුව**
(Agriculture Training)




**20 වන කණ්ඩායම සඳහා**

**පාඨමාලා ආරම්භය:**

**2023 මැයි මස 20 වන දින**
**පන්නල IHFC**
**මධ්‍යස්ථානයේදී**



**අප ආයතනයේ හැදෑරිය හැකි වෙනත් පාඨමාලාවන්:**

- Pearson HND in Business Management
- Pearson HND in Computing
- Top-Up Degree in Business Management and IT
- AQUINAS Diploma in English (Level 1 to Final)
- Diploma in Teacher Training
- TEFL (Teaching English as a Foreign Language)

විමසීම්: Very Rev. Fr. Sagara Prishantha Perera - Director | 071 20 300 77 | www.jvi.lk | info@jvi.lk

Pearson IDM Creating Opportunities Nurturing Achievers UNIVERSITY OF GLOUCESTERSHIRE TVEC Registration: P12/0226

මිල රු.100/=
(සහන මිල)

"භක්ති ප්‍රබෝධනය" සංස්කාරක ගරු එමාඩ් දල්පතාදු නි.ම.නි. පියතුමන් විසින් කොළඹ කතෝලික මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී. පුවත් පතක් ලෙස තැපැල් හලේ ලියාපදිංචි කර ඇත. DOP/NEWS/01/2024